සයුරෙන්

එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
ISSN 1391 5145
2022 ජනවාරි

ඔබ සැමට සුභ නව වසරක් වේවා !

ජායාරූපය අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී.

නව වසරක උදාව

දින 365 කට වරක් නව වසරක් උදාවෙයි. ඒ උදාව ගණනය කිරීම සඳහා ඈත අතීතයේ සිටි මිනිසා විවිධ වූ න්‍යායන් අනුග මනය කොට ඇත. මේ සඳහා විවිධ වූ විද්‍යාත්මක හා පාරිසරික වූත් භෞතික වූත් ක්‍රමවේද පෙරදිග වැසියන් භාවිතා කරතත් අප දැනට ව්‍යවහාරික වශයෙන් භාවිතා කරන ක්‍රි. ව. ක්‍රමයට එවැනි භෞතික හෝ පාරිසරික පදනමක් නැත. වර්තමාන දිනදර්ශනයට අනුව දෙසැම්බර් 31 මධ්‍යම 12.00 පසුවීමත් සමග දිනය හා වර්ෂය අවසන් වී යයි. එම අවසන් වීමත් සමග ලෝක ජනතාව නව වසර පිළිගනිති.

මෙම උදාවත් සමග සැමගේ ප්‍රාර්ථනාව වන්නේ එළඹුන නව වසර සෞභාග්‍යයෙන් පිරුනා වූ සියලු අපේක්ෂා ඉටුවන නිරෝගී සුවයෙන් යුත් වාසනාවන්ත වසරක් වේවා යන එකම පැතුමකි. ප්‍රාර්ථනාව එසේ වුවත් ඒ භාග්‍යය හිමි වන්නේ ඉතා අතලොස්සකටය. එය එසේ වුවත් හැමගේ ප්‍රාර්ථනය එය වන්නේමය. එම ප්‍රාර්ථනාව ආදරය කරුණාව මෛත්‍රිය පෙරදැරි කරගත් යහපත් ප්‍රාර්ථනාවකි.

ප්‍රාර්ථනාවකින් පමණක් එය ඉටුවන්නේ නැත. සෑම පුද්ගලයෙක්ම සිය චිත්තාභ්‍යන්තරයෙන්ම ඒ සඳහා ඇප කැප වන්නේ නම් එය තරමක් දුරට යථාර්ථයක් බවට පත්කර ගත හැකි වනු ඇත. එය එසේ නොවී හුදු ප්‍රාර්ථනයක් පමණක් කරගන තම සුබ විහරණය පමණක් සිතා හොඳින් හෝ නරකින් තම සිතුම් පැතුම් ඉටුකර ගැනීමට කටයුතු කරන්නේ නම් සිතැඟි ඉටුකර ගැනීමට කටයුතු කරන්නේ නම් එයින් ලෝකයට සාධාරණයක් ඉටු නොවේ.

වර්තමාන ලෝකය වනාහී මහා දැවැන්ත අර්බුධයකට මුහුණ පා සමස්ත ලෝක ජනතාවම රෝගී භාවයට පත්ව හෝ රෝගී බියෙන් වෙලී මුළු ගැන්වී සිටින අවදියකි. එවැනි බියකට පත්ව දෙවසරක් ගතවී තෙවන වසරට එළඹීමයි මේ සිදුවන්නේ.

ලෝක ජනගහන යෙන් කෝටි සංඛ්‍යාත ජනතාවක් කොවිඩ් වසංගතයෙහි ගොදුරු වී සිටින අතර ලක්ෂ 25 ට අධික සංඛ්‍යාවක් එයින් මේවන විටත් මිය ගොස් සිටින අතර ඉතිරි වී සිටින සියලු ජනයා එයට ගොදුරු වේද නොවේද යන අවිනිශ්චිත බියෙන් වෙලී සිටින යුගයකි.

මෙම වසංගතයත් සමග තම අභිමුවට පැමිණ සිටින සමාජ ආර්ථික දේශපාලන පීඩාකාරී අර්බුධයෙහි සියලු ජනයා ගොදුරු බවට පත්වී සිටින නව වසරකි. මෙම අනතුරේ බරපතල තත්වය කොතරම් බලවත් ද යන්න නව වසර තුළවත් මෙම අර්බුධයෙන් ලෝකය ජය නොගන්නා බව සාමාන්‍ය දැනුම ඇති සෑම කෙනෙකුම පිළිගන්නවාට සැක නැත. ඒ තරමටම කොරෝනා වෛරසය ලෝක සමස්ත සමාජය තුළම ඔඩු දුවා ඇත.

ලෝකයම එවැන්නකට මුහුණ දී ඇති අවස්ථාවේ නව වසර කිරියෙන් පැණියෙන් ඉතිරේවා යයි ප්‍රාර්ථනා කරන අති මහත් බහුතරයක් මෙම අර්බුධයෙන් ගොඩ ඒමට කළ යුතු ක්‍රියාකාරීත්වයන් තුළ ප්‍රායෝගිකව නියැලී නොමැති තත්ත්වයක් තුළ එය සුපුරුදු ප්‍රාර්ථනයක් පමණි.

වර්තමාන ලෝකය වනාහී මහා දැවැන්ත අර්බුධයකට මුහුණ පා සමස්ත ලෝක ජනතාවම රෝගී භාවයට පත්ව හෝ රෝගී බියෙන් වෙලී මුළු ගැන්වී සිටින අවදියකි. එවැනි බියකට පත්ව දෙවසරක් ගතවී තෙවන වසරට එළඹීමයි මේ සිදුවන්නේ.

ලෝක ජනගහනයෙන් කෝටි සංඛ්‍යාත ජනතාවක් කොවිඩ් වසංගතයෙහි ගොදුරු වී සිටින අතර ලක්ෂ 25 ට අධික සංඛ්‍යාවක් එයින් මිය ගොස් සිටින අතර ඉතිරි වී සිටින සියලු ජනයා එහි ගොදුරු බවට පත්වේද නොවේද යන අවිනිශ්චිත බියෙන් වෙලී සිටින යුගයකි.

තම ප්‍රාර්තනය ඉටුවී සෞභාග්‍ය ලඟාකර ගැනීමට නම් සමස්ත ලෝක ජනයා සියලු දෙනාම එකාමෙන් ඒ අරමුණෙන්ම කටයුතු කළ යුතුය. එය එසේ වන්නේ යැයි සිතිය නොහැක. එය එසේ වන්නේ ද නැත. එය එසේ බැවින් නිරෝගී සුවය ලැබීමට නම් තවත් බොහෝ කාලයක් ගත වනු ඇත. නිරෝගී බවක් නොමැති බැවින් හැම විටම සිදුවන්නේ අලාභයකි. ඒ නිරෝගී බව පරම ලාභය බැවිනි. නිරෝගී බව නොමැති කමින් සතුට ගිලිහී යයි. සතුටක් නොමැති තැන ධනයද නැත භෞතික ධන සම්පත් කොතෙක් තිබුණත් පරම ධනය සතුට බැවින් ඒ භෞතික ධන සම්පත් වලින් ප්‍රායෝජනයක් නැත.

මේ නිසා ධනය හා සතුට නොමැති හා එවැන්නක් පේන මානයක නොමැති යුගයක එළඹෙන නව වසර තුළ කරන ප්‍රාර්ථනා හුදු ප්‍රාර්ථනා පමණි. අපි අකමැත්තෙන් වුවත් පිළිගත යුතු ඇත්ත, සත්‍යය, යථාර්ථය එයයි. එ නිසා ප්‍රාර්ථනාවට වඩා වැදගත් වන්නේ මිනිසා ගේ ක්‍රියාවයි. තම ක්‍රියාවන් තුළින් නව වසර සුබ වේද නොවේද යන්න තීරණය කළ හැක.

(Sinhala Version)

නිවාස නිරෝධායනයට ලක්ව සිටින්නා දැනුවත් විය යුතු කරුණු



හැම මොහොතකම ගෙදර සිටින්න

මුහුණු ආවරණයක් පළඳින්න

රෝග ලක්ෂණ වර්ධනය වුවහොත් සෞඛ්‍ය තත්වය අධීක්ෂණය කරන්න ඒමෙන්ම ඉක්මන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න

හැකි නම් හොඳින් වාතාශ්‍රය ඇති තනි කාමරයක රැඳී සිටින්න

හැකිතාක් වෙනත් පුද්ගලයින් සමඟ දුරස්ථතාවයක් (අවම වශයෙන් මීටර 1 ක් දුරින්) පවත්වා ගන්න

වැසිකිළිය භාවිතා කිරීමෙන් පසු, වැසිකිළි පියන වතුර ගැසීමට පෙර වසා දමන්න

සෑම කාණු කටකටම (යු-උගුල්) නිතිපතා ජලය වත් කරන්න

තුවා හෝ පුද්ගලික අයිතම අන් අය සමඟ බෙදා ගැනීමෙන් වළකින්න

ආහාර බෙදා ගැනීම සහ ආහාර ගැනීමට රැස්වීමෙන් වළකින්න

දුම් පානය හා මත්පැන් පානය කිරීමෙන් වළකින්න

衞生防護中心
Centre for Health Protection

更多防疫資訊
For more information on fighting the virus:
www.coronavirus.gov.hk

衞生防護中心Facebook專頁
Centre for Health Protection Facebook Fanpage
fb.com/CentreforHealthProtection

衞生署
Department of Health

二零二零年三月製作
Produced in March 2020

අද වන විට ලංකාවේ අභය භූමි ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ජනයාට ඇති ප්‍රමුඛතම ප්‍රශ්නයක් බවට පත්වී ඇත්තේ අලි මිනිස් ගැටුමයි. මේ ගැටුම හේතුවෙන් අලි අතින් මිනිසුන්ද මිනිසුන් අතින් අලි ද නිරන්තරයෙන් මිය යති. ඊට අමතරව ජනතාවගේ ගොවිතැන්බත් ගෙවල් දොරවල් අලි ඇතුන් අතින් විනාශ වෙති. අලි ගහනය දිනෙන් දින මෙම ගැටුම හේතුවෙන් අඩුවෙමින් පවතී.

ලංකාවේ අලි උරුමය

අලින් කෙරෙහි මිනිසා තුළ ඇති ආදරයත් වෛරයත් එක සේ පවතී. ඔවුන් අතින් සිදුවන විනාශය දුප්පත් ජනයාට දරා ගත නොහැක. එසේම අලියාගේ ස්වභාවය හා හැසිරීම මිනිස් නෙත වසඟ කරයි.

මුහුදින් වටවූ දූපතක් වූ ලක්බිම තුළ අලි කෙසේ හට ගත්ද යන්න කිසිවෙකු සෙයා බලා ඇතැයි අපට සිතිය නොහැක. නමුත් ලංකාවේ ලිඛිත ඉතිහාසය පුරාම අලින් පිලිබඳ තොරතුරු ලැබෙති. ඒ පිළිබඳව රසකතා මෙන් දුක් කඳුළු ද ඕනෑම තරමක් සොයා ගත හැක.

එසේම පුරානයේ සිට අලි ඇතුන් මිනිසා සිය අවශ්‍යතා වෙනුවෙන් යොදාගෙන ඇත. අදටත් වඩා පෙර දවස අලි ඇතුන් මිනිසාට සේවය සලසා ඇත.

පුරාන රජ වරුන්ගේ අලි ඇතුන් ගෙන සපිරි යුධ සේනාංකයක්ද තිබී ඇත. සිවුරඟ සේනාවෙන් එකක් ඇත් සේනාංකය යුධ කටයුතු වලදී යුද ජයග්‍රහන වෙනුවෙන් ඉමහත් සේවයක් කොට ඇත. මිනිසා වෙනුවෙන් යුධ වැදී දිවි දුන් අලි ඇතුන් ඕනෑ තරම් ඉතිහාසයේ ඇත.

බෞද්ධ පෙරහැරක අලි ඇතුන් නොසිටියොත් එම පෙරහැර කෙරෙහි ජනතා ආකර්ශනය නැතිවී යයි. පෙරහැරක් දුටුවිට අලි ඇතුන් කී දෙනාද යැයි නිතැතින්ම මනසට නැගේ. රජ කාලයේ දඬුවම් දීමේදීද අලියා යොදා ගෙන ඇත. ගොවිතැන් කටයුතු වලදී සී සෑම සඳහා ද අලි ඇතුන් යොදා ගත් අතර රජකම ප්‍රධානය කිරීමේදී ද ඇතා වැදගත් සේවාවක් ඉටුකොට ඇත.

දඹුලු විහාරයේ බිතු සිතුවම් වල දක්වා ඇති පරිදි දෙවන පැතිස් රජු අනුරාධපුර මහමෙව්නා උයන සඟසතු කොට පිදීමේදී මඟුල් ඇතුළවා නගුලෙන් මායිම් ලකුණු කළ අන්දම මහා වංශයේ දක්වා ඇත. චූල වංශයේ දක්වා ඇති පරිදි පොළොන්නරුවේ මහා පැරකුම්බා රජු අලාහන පිරිවනට ගම්බිම් ලබාදීමේදී ද අනුගමනය කර ඇත්තේ මේ පිළිවෙතයි.

මුහුදින් වටවූ දූපතක් වූ ලක්බිම තුළ අලි කෙසේ හට ගත්තාද යන්න කිසිවෙකු සෙයා බලා ඇතැයි අපට සිතිය නොහැක. නමුත් ලංකාවේ ලිඛිත ඉතිහාසය පුරාම අලින් පිලිබඳ තොරතුරු ලැබෙති. ඒ පිළිබඳව රසකතා මෙන් දුක් කඳුළු ද ඕනෑම තරමක් සොයා ගත හැක.

දුටුගැමුණු මහ රජතුමාගේ යුධ ජයග්‍රහන වලදී කඩොල් ඇතු කළ සේවය අප්‍රමානය. දුටු ගැමුණු රජු වෙනුවෙන් මහා වංශයේ විශාල ඉඩකඩක් ලබා දී ඇත. විජිතපුර බලකොටුව බිඳ දැමීමට යොදා ඇත්තේ කඩොල් ඇතාය. එළාර රජුගේ විජිත පුර බලකොටුව බිදීම සඳහා ඒ අසලට දුවගිය කඩොල් ඇතුගේ පිට මත උණුකළ ඊයම් වක්කළ බව සඳහන් පිලිස්සී දැවුණු ඇතු මහත් වේදනාවෙන් පසු බැස ඇති අතර දැඩි සේ රෝගාතුර විය. වෙදුන් ලවා බෙහෙත් ගල්වා හරක් හම් ඔතා ඇතා සුවපත් කළ අයුරුත් දෙවන අවස්ථාවේ ඇතා විජිතපුර බලකොටුව බිඳ දැමූ අයුරුත් ඉතිහාසයේ ලියවී ඇත.

කඩොල් ඇතු පුහුණු කිරීමේදී ඇතුට රා පොවා කුලප්පු කරන ලදී. වෛරී මතින් මත්වූ මහත් ශක්තියක් ඇති දැවැන්ත හස්තියා පාලනය කිරීම කාටත් අපහසුවිය. හස්තියා පාලනය කිරීම කාටත් අපහසුවිය. හස්තියා පාලනය කිරීම පැවරුනේ නන්දිමිත්‍ර යෝධයාටය. නන්දිමිත්‍ර ඇතුගේ දළ දෙකෙන් අල්ලා ඇතා පසුපසට තල්ලු කළේය. මෙයින් කිපුනු ඇතා නන්දිමිත්‍ර ගැන දැඩි වෛරයෙන් පසුවිය. ලද අවස්ථාවක පහරදීම සඳහා සිය මුඛයේ නිතරම ගලක් රදවාගෙන සිටියේය. විජිතපුර සටනේදී සතුරන් විසින් කඩොල් ඇතු වෙත ගලක් පෙරලීය. ඇතු මතට ගල පෙරලීමට ආසන්න වෙද්දී එය දුටු නන්ත්‍රමිත්‍ර ගල වලකා ඇතා බේරා ගත්තේය. මෙය දුටු කඩොල් ඇතා සිය මුඛයේ තිබූ ගල ඉවත් කර නන්දිමිත්‍ර කෙරෙහි තිබූ වෛරය පහ කරගත්තේය. එළාර රජුගේ පර්වත ඇතා සහ දුටුගැමුණු රජුගේ කඩොල් ඇතා අතර ඇතිවූ ද්වන්ද සටන ගැනද කියවෙයි.

එළාර දුටුගැමුණු යුධ සමයේ එළාර ගේ බෑණා කෙනෙකු වූ හල්ලුක සේනා සන්නද්ධව ලක්බිමට ගොඩ බැස්සේ එළාර ගේ සහායටය. එම සේනාව යුධ පෙරමුණට ඒ මේදී කඩොල් ඇතු ප්‍රමුඛ කරගත් යුධ සේනාවක් විසින් හල්ලූක ගේ යුධ සේනාව විනාශ කළ බව දක්වෙයි. උතුරු මැද පළාත් වල ජනයා මහත් භක්තියෙන් අදහන අයියනායක දෙවියන් යනු කඩොල් ඇතා සහ පර්වත ඇතා අතර වූ සංකලනයක් ලෙස ද විශ්වාස කරන පිරිස් සිටිති.

බුද්ධ වර්ෂයෙන් 981 දී ලක්බිම රජ කළේ ඉලනාග රජුය. ඔහු ජලස්නානය කරමින් සිටිය දී සතුරු සේනාවක් රජු අත් අඩංගුවට ගෙන සිරගත කළේය.

එම අවස්ථාවේ රජුගේ අගමෙහෙසිය මඟුල් ඇතු මෙහෙයවා සිපිරි ගෙය බිඳ දමා රජු එළියට ගත්තේය. එළියට ආ රජු මලය රටට නැව් නැග ගොස් තුන් අවුරුද්දකට පසුව සේනාව සංවිධානව රුහුණු පුර අකුරුගොඩින් ලක්බිමට ගොඩ බැස මඟුල් ඇතු

5 වෙනි පිටුවට...

4 වෙනි පිටුවෙන් ...

හා එක්ව ආක්‍රමනික රජු සමග යුධ වැද ජය ගත්තේය. අකුරුගොඩ නැව් තොට වර්තමාන සීනිගම දේවාලය ඇති ස්ථානයයි මතයක් ද පවතී. මඟුල් ඇතුට උපහාරයක් වශයෙන් ඇතා විසූ ප්‍රදේශය ජනපදයක් කොට හස්තු භෝග ජනපදය යැයි නම් කළේය.

ක්‍රි.ව. 474 දී සීගිරි කාශ්‍යප සිය සොහොයුරු මුගලන් කුමරු ගේ සේනාවට මුහුණ දීමට මඟුල් ඇතු පිට පැමිණි බවත් ඉදිරියේ තිබූ

මඩවලක් මගහැරීම සඳහා රජු මගුල් ඇතා ආපසු හැරවීය. මෙය දුටු පසු පස සේනාව සිතුවේ රජු පරාජය පිළිගෙන ආපසු හැරුණු ලෙසය. සිය සේනාව හිස් ලුලු අත දිවූහ. තනිවූ රජු මගුල් ඇතු පිට සිටම සිය මගුල් කඩුවෙන් ගෙල කපා ගත්තේය.

ක්‍රි.ව. 11 පොළොන්නරුවේ රජ කළ මහ පැරකුම්බා රජ රාමඤ්ඤ දේසය ආක්‍රමණය කළේ ලක්දිවෙන් යැව් වෙළඳ භාණ්ඩ සඳහා ගිවිසුම් ප්‍රකාරව ඇතුන් නො සැපයූ නිසා බව කියවෙයි.

ඇතෙකු නිසා තිස්පන් දහසක් ඝාතනය වූ යුද්ධයක් ගැන ද ඉතිහාසයේ කියවෙයි. ක්‍රි.ව. 1635 - 1687 රජ කළ දෙවන රාජසිංහ රජු සුවඳ විලවුන් අරුමෝසම් භාණ්ඩ සඳහා ඇලූම් කළ අයෙකි. අවසර ඇතුව උඩරටට ආ පෘතුග්‍රීසි වෙළෙන්දෙකු රජු කැමති මෙවැනි දේ පරිත්‍යාග වශයෙන් පිරිනැමීය. රජු ඔහුට ඇතෙකු තෑගි කළේය. මෙකල පෘතුග්‍රීසි ආණ්ඩුකාරයා වූයේ දියෝගුද මෙලෝ සෙනෙවියාය. ඔහු අහංකාර පරවේශ රජු හා සිංහලයා නොතැකූ අයෙකු විය. ඔහු මෙම ඇතා වෙළෙන්දාගෙන් බලෙන් පැහැර ගත්තේය. මේ බව රජුට වෙළෙන්දා දැන්වීය. වෙළෙන්දා තවත් ඇතෙකු ලබා දී මන්නාරම් තොටින් පිට කළේය.

ටික දිනකින් ආණ්ඩුකාරයාට අයත් අශ්වයින් 4 දෙනෙකු අතුරු දහන් විය. දියෝගුරු මෙලෝ මේ බව රජුට දැන්වීය. ඇතා පණ පිටින් ලබා දෙන්නේ නම් අශ්වයින් 4 දෙනාද ආපසු දෙන බව රජු ඔහුට දැන්වීය. එයට පිළිතුර වශයෙන් ආණ්ඩුකාරයා කළේ තිස්පන් දහසක සේනාවක් සමඟ උඩරට ආක්‍රමණය කිරීමයි. පෘතුග්‍රීසි බලඇණියත් දහසක් වූ අතර සෙස්සෝ සිංහල දෙමළ මරක්කල කාපිරි ආදී පිරිස් විය. ගන්නොරුවේදී දෙපාර්ශ්වය මුණ ගැසී සටන ඇති විය.

කාපිරි සෙබළෙකු එල්ල කළ වෙඩි පහරකින් රජු ගේ හිස් වැස්ම පැත්තක් කැඩී ගියේය. වහා ක්‍රියාත්මක වූ රජු සිය තුවක්කුවෙන් කාපිරියාගේ හිසට වෙඩි තැබීය. කාපිරි හිසත් කැඩී ගිය රජුගේ හිස් වැස්මත් තුවක්කුවත් කෞතුක භාණ්ඩයක් ලෙස රජුගේ මහා භාණ්ඩාග ාරයේ තැන්පත් විය. දියෝගුද මෙලෝ ඇතුලූ තිස්පන්දහසක හමුදාව විනාශ වූ අතර පෘතුග්‍රීසි සෙබලූන් 7 දෙනෙකු පමණක් එම සටනින් ඉතිරි වූ බව පැවසේ. මෙම අලි ප්‍රශ්නය මිනිස් ඝාතන තිස්පන් දහසකට අධික සිදුවීමට හේතු විය.

කුරුණෑගල යුගයේ ලියවුණු පූජාවලිය ග්‍රන්ථයන් මෙම සියවසේ දී පානදුරේ මුදලින්ද්‍රාරාම විහාරය හෙවත් වැලිපිටිය විහාරයේ වැඩ විසූ මොරටුවේ මේධානන්ද හිමියන් ලියූ පාලි කාව්‍යය දෙදහසකින් ලියවූ බුද්ධ චරිතය පිළිබඳ ජිනවංශදීප මවන කාව්‍යයන් ඇතුන් සහිත මහා පෙරහැරවලින් වීදි සංචාරය කරවූ බව එම වාර්තාවල දැක්වෙයි.

ගම්පොල යුගයේදී මෙරටට පැමිණි විදේශ සංචාරකයෙකුගේ ලේඛනවලට අනුව එකල රජුට අයත් සුදු ඇතෙකු සිටි බවට සඳහන් වෙයි. තවද 1587 - 1588 කාලයේ සීතාවක රාජසිංහ රජු කොළඹ වටලා පෘතුගීසීන් කොළඹ කොටුවට සීමා කළේය. එකළ බොරලූ ගොඩ නමින් හැඳින්වූ වර්තමාන අලූත්කඩේ ප්‍රදේශයේ රජු කඳවුරු බැඳගත්තේය. මෙම සටනින් පරංගීන්ට ආහාර හිඟ විය. බළල් මස් පවා පරංගී ආහාරයට ගත්හ.

එම සටනේදී අලි ඇතුන් දෙදහසක් පමණ සටනට යෙදවූ බව කියවෙයි. පරංගීන්ට සිදු වූ ආහාර හිඟය හේතුවෙන් ඔවුන් මිනීමස්ද අනුභව කළ බවත් ඔවුන්ට අයත්ව සිටි ඔවුන් ආදරය කළ ඩර්නෙලා හෙවත් සුරතලා නමින් හැඳින්වූ ඇතෙකු කොළඹ කොටුවේ සිටි බවත් ඌට මරණය අත් නොවූ බවත් පෘතුග්‍රීසි ජාතික ජුවාන් රුබේරු නම් ලේඛකයා ගේ වාර්තාවල දැක්වේ මෙකල ඉන්දියාවේ විසූ මෝගල් අධිරාජ්‍යයාට ලංකාවේ අලි ඇතුන් විකිණීම පෘතුග්‍රීසීන් ගේ ප්‍රධාන ආදායම් මාර්ග යක් වූ බව පැවසේ. එකළ ලංකාවේ අලි ඇතුන්ගේ මිල පන්දාහේ අටදාහේ සිට පහළොස් දහස දක්වා පැවති බවත් වෙනත් ඕනෑම රටක අලියෙකු ගේ මිළට වඩා ලංකාවේ අලින්ගේ මිල ඉහළ බව පෘතුග්‍රීසි ලේඛක ක්වෙයිරෝස් සඳහන් කරයි. දෙවන රාජසිංහ සමයේ සිරකරුවෙකු වූ රොබට් නොක්ස් පසුව ලියූ එදා හෙළදිව ග්‍රන්ථයේ රජුට අලි ඇතුන් දෙදහසක පමණ සේනාවක් සිටි බවත් තිත් සහිත ඇතෙකු සිටි බවත් ඔහු ලියා ඇත.

හීලෑ ඇතින්නියන් යොදවා දළ ඇතුන් ඇල්ලීම එකළ එක් ක්‍රමයකි. මද්දක් ගසා ද අලි අල්ලනු ලබයි. අලින් ගෙන් කෙතරම් ගම්බිම්වලට හානි ඇති වුවද ඔවුන්ට හානි කිරීම එකළ ජනතා සිරිත නොවේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඇතු පිටින් මාතලේ සංචාරය කරද්දී ඇතා මද කිපී ඇත් ගොව්වාද මරා දමා වන වැදී ඇත. ඇත් ගොව්වා මැරූ ස්ථානය ඇතා මැරූගල නමින් ප්‍රකටය. ප්‍රාදේශීය රජෙකු වූ අග්බෝ රජු සමඟ යුද වැදුනු තවත් රජ කෙනෙකුගේ ඇතා මරා දැමූ ස්ථානය ඇත් මල්කඩ නමින් සිහිවටන තැබූ තැනුත් අලව්ව ප්‍රදේශයේ අදද ඇත. සිහසුනට සුදුස්සෙකු තේරීමේදී මඟුල් ඇතා සරසා යවන අතර යමෙකු ඉදිරියේ ඇතා දනගැසුවොත් ඔහු සිහසුනට තෝරා ගන්නා පිළිවෙතක් පුරාණයේ තිබී ඇත. එකළ දඹදෙණියේ රජ වූ අප්පුකුමරු ඉදිරියේ ඇතා දන ගැසුවේ කුඹුරේදීය.

මඟුල් ඇතා එනවිට අප්පුවා කුඹුරේ වැඩ කොට අසල ගලක දිවා ආහාරය ගෙන විවේකීව සිටියේය. එතනදී ඇතා දන ගැසූ බව කියවෙයි. ඇතාගේ දළ ඇනුනු ස්ථානය එම ගල්තලාවේ දී අදත් දැකිය හැකිය. නාරම්මල පින්නපොල වෙල්යායේ මෙම ස්ථානය අදටත් ඇත. සිංහලේ අවසන් රජු ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිරභාරයට ගත් පසු ඔහුගේ මඟුල් ඇතා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළ බවත් එම සතා 1889 අගෝස්තු මාසයේදී මිය ගිය බවත් ෆර්ගියුසන් වාර්තාවල දැක්වෙයි.

මෙරට අලිඇතුන් පිළිබඳ නොයෙක් තොරතුරු සිද්ධි ජන කථා කවි කතා ආදියේ දක්නට ඇත. පනාමුරේ සිටි ඇත් රජා ද එවැනි ප්‍රකට ඇතෙකි. ඈත අතීතයේ සිට මෙරට අලින් ඇතුන් රටට ජනතාවට හා රාජ්‍යත්වයට මනාව බද්ධ වී සිටි සතෙකි. ලංකාවේ අලි නැරඹීම සඳහා අදද විදේශ සංචාරකයින් රට තුළට පැමිණෙති. ගම් හා වනාන්තර අතර නිසි කළමනාකාරිත්වයක් නොමැති හේතුවෙන් අලි ඇතුන් අද මිනිසාට මහත් තර්ජනයක් වී ඇත.

අපගේ ඉතිහාසයත් සංස්කෘතියත් සාහිත්‍යයත් මෙන්ම ආගමික කටයුතුත් අතර මනාව බැදී ඇති ලංකාවේ අලි ඇතුන් වඳ වීමට ඉඩ නොදී නිසි ලෙස රැකගැනීම අපගේ යුතුකමක් වන්නෙමු.

මෙරට අලිඇතුන් පිළිබඳ නොයෙක් තොරතුරු සිද්ධි ජන කථා කවි කතා ආදියේ දක්නට ඇත. පනාමුරේ සිටි ඇත් රජා ද එවැනි ප්‍රකට ඇතෙකි. ඈත අතීතයේ සිට මෙරට අලින් ඇතුන් රටට ජනතාවට හා රාජ්‍යත්වයට මනාව බද්ධ වී සිටි සතෙකි. ලංකාවේ අලි නැරඹීම සඳහා අදද විදේශ සංචාරකයින් රට තුළට පැමිණෙති. ගම් හා වනාන්තර අතර නිසි කළමනාකාරිත්වයක් නොමැති හේතුවෙන් අලි ඇතුන් අද මිනිසාට මහත් තර්ජනයක් වී ඇත.

ස යු රේ න් ඒතෙර
ඒතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය



නව වසරේ සුභාසුභ

වසරක් ගෙවී වසරක් උදාවන විට ලැබෙන්නාවූ නව වසර රටට සමාජයට මෙන්ම තම තමාට කොතෙක් දුරට යහපත් අයහපත් බවක් වේද යන්න ජ්‍යොතිෂ්‍යානුකූලව විමසා බැලීම ආසියාතික සමාජයේ සිරිතක්ව පවතී.

ඒ අනුව 2021.12.31 මධ්‍යම රාත්‍රියේ 12.00 ට රාශි චක්‍රය හා නව ග්‍රහයින් පිහිටා ඇති අයුරු විමසා බලමු. මෙම වේලාවට කන්‍යා ලග්නය අංශක 13 කලා 53 යන ස්ඵුටයේ පවතී. හත නැකතේ දෙවන පාදයත් වෘශභ නවාංශකයත් උදාවන අතර සඳු ග්‍රහයා දෙට නැකතේ පළමු පාදයේ එනම් වෘශ්චික රාශියේ අංශක 17 කලා 53 හි ගමන් කරයි. ඒ වේලාවට උදාවන ග්‍රහචාරය මෙසේය.





මෙම වේලාවට ශ්‍රී ලංකා කේන්ද්‍රයේ ගෝචර ග්‍රහ ගමන පවතින්නේ මෙසේය.



මෙම ග්‍රහ පිහිටීම සුබ ග්‍රහ පිහිටීමක් නොවේ. කාලසර්පයෝගයක් සහිතව නව වසර උදාවෙයි. රටක් වශයෙන් නව වසර සතුටු විය හැකි නොවේ. ලග්නාධිපති ශනි ග්‍රහයා වැය ස්ථානයට ගොස් සිටින බැවින් දැනට පවතින රජයේ මූල්‍ය අර්බුධය වර්ෂය තුළද එසේම වතිනු ඇත. වැය බර ඉහළට යන අතර අය තත්ත්වයේ වැඩිවීමක් දක්නට ලැබෙනු ඇත. ආර්ථික වශයෙන් පෙර වසරට වඩා යම් පහසුවක් දැනෙන නමුදු එය සතුටට කරුණක් නොවන්නේය. රාජ්‍ය පරිපාලනයේ අවුල් සහගත බව එලෙසම පවතින බැවින් වර්ජන ගර්ජන උද්ඝෝෂණ අකාර්යක්ෂමතාව දිගටම පවතී.

විරුද්ධ පක්ෂයේත් විරුද්ධවාදීන්ගෙනුත් රජයට විශාල තර්ජනයක් මෙන්ම ඔවුන් ගේ නැගී සිටීම ප්‍රබල වන අතර එම පක්ෂ හා සංවිධානවල වර්ධන වේගය වැඩිවෙයි. සාමාන්‍ය පොදු ජනයා ගෙන් රජය කෙරෙහි ඇතිවන අප්‍රසාදය වැඩිවන අතර සාමය සංහිදියාව නිහඬතාවය දැකිය නොහැකිය. මේ තත්ත්වය රටේ ඉදිරි ගමනට සුබදායක නොවනු ඇත.

උගතුන් බුද්ධිමතුන් සමාජ ක්‍රියාධරයින් මුලුග ැන්වෙන අතර ඒ වෙනුවට සමාජ දූෂකයින් හිස ඔසවනු ලබයි. ස්වභාව ධර්මයේ යහපත් බැදීම් අපේක්ෂා නොකළ හැකි අතර වසංගත තත්ත්වයේ අඩුවක් ඇති නොවේ.

මේ වසරේදීවත් හොඳක් වේදෝයි අපේක්ෂාවෙන් කිසියම් පිරිසක් වේ නම් ඒ අපේක්ෂා යහපත් අයුරින් මල්ඵල ගැන්වෙන වසරක් යැයි සතුටු විය හැකි වසරක් නොවේ.

මේෂ ලග්නය



ලග්නාධිපති කුජ මාරක ස්ථානයේ ස්වක්ෂේත්‍රව නීච වූ චන්ද්‍රයා හා යෝගවී සිටියි. කේතු ද එතනමය. පුන්‍යස්ථානයේ රවි හා සිකුරු සිටින අතර ශනි හා බුධ දස වැන්නේද ගුරු අයස්ථානයේද රාහු දෙවැන්නේද සිටිමින් මේෂ ලග්න හිමියාට නව වසර උදාවෙයි.

තැන්පත් ධනය යහමින් වැය වන අතර ගෘහ ජීවිතයේ අකර්මන්‍යතා බොහෝය. දරුවන්ගේ දියුණුව අපේක්ෂා කළ හැකි අතර ශරීර සෞඛ්‍යය ගැන සතුටු විය නොහැක. විවාහ අපේක්ෂා කරන්නන්ගේ අදහස් සඵල වන අතර විවාහකයින් අතර ගැටුම් ඇතිවෙයි. රැකීරක්ෂා කටයුතු වලදී නොයෙක් පීඩාකාරී ස්වභාවයක් ඇතිවන අතර රැකියාවේ දියුණුව අපේක්ෂා කළ නොහැක.

ආදායම් මාර්ග මන්දගාමී ස්වභාවයක් ගන්නා බව පෙනේ. උසස් තලයේ හිත මිත්‍රයින් හා සම්බන්ධ වීමට අවස්ථාව හිමිවෙයි. උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන්නන්ට හා විදේශගතවීමට අපේක්ෂාවෙන් සිටින අයට එම කටයුතු සාර්ථකව කරගැනීමට අවස්ථාව හිමිවෙයි.

දැනට සඳු, කුජ, රාහු, කේතු දශා ගෙවන්නන් හා උපතේ දී සඳු 9,10,11 රාශිවල සිටි අයට මෙම කාලය බොහෝ කරදර ඇතිවන කාලයක් බව ද කිව යුතුය.

වෘෂභ ලග්නය



ලග්නාධිපති සිකුරු රවි සමග අට වැන්නේත් සඳු, කුජ හා කේතු හත්වැන්නේත් බුධ ශනි නව වැන්නේත් ගුරු දස වැන්නේ සහ රාහු ලග්නයේත් සිටියදී වෘශභ ලග්න හිමියාට නව වසර උදාවන්නේ ගමන් බිමන් රැසක් යෙදෙන වසරක් වශයෙනි.

මෙම වර්ෂය තුළ දුර බැහැර ගමන් බිමන් රැසක් යෙදෙන නමුත් ඒවා එතරම් ප්‍රතිඵල දායක නොවේ. අතිශ්‍ය කාර්ය බහුල අවිවේකී වසරකි. ආදායම් තත්ත්වය එතරම්ම අසතුටුදායක නොවෙන නමුත් ලොකු දියුණුවක් අපේක්ෂා කළ නොහැක.

දරුවන්ගේ දියුණුව අපේක්ෂා කළ හැකි අතර සාමාන්‍ය ගෘහ ජීවිතයද එතරම් සතුටුදායක නොවේ. ආගමික කටයුතු වලට සිත යොමුවන අතර වෘත්තිය ක්ෂේත්‍රයේ දියුණුවක් දැකිය හැකිය.

විවාහාපේක්ෂාවෙන් සිටින අයගේ විවාහ කටයුතු ඉක්මන් වන අතර විවාහකයින් අතර මත ගැටුම් ඇතිවිය හැක. තමාට වඩා උසස් මට්ටමේ අය ඇසුරු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙන මෙම වසරේ විදේශ ගමන් අපේක්ෂාවෙන් සිටින්නන්ට සුබඵල උදාකරයි. බුධ, ගුරු සහ ශනි ගේ දශා අතුරු දශා ගෙවන අයට මෙම වසරේ ලැබෙන සුබඵල වැඩිය.

මිථුන ලග්නය



ලග්නාධිපති බුධ අට වැන්නේ ශනි සමග ගමන්කරන අතර චන්ද්‍ර කුජ හා කේතු හයවැන්නේද රවි හා සිකුරු හත්වැන්නේද ගුරු නව වැන්නේත් රාහු දොළොස්වැන්නේත් සිටියදී වැය බර අධික වර්ෂයක් වශයෙන් නව වසර ඔබට උදාවෙයි.

වන්දනා ගමන් විදේශ ගමන් ආදී දුර බැහැර ගමන් රාශියක් යෙදෙන මෙම වර්ෂයේ වැය පක්ෂය ඉහළ යයි. සතුරන් හා බාධක මැඩගෙන ඉදිරියට යා හැකි වසරකි.

විවාහ අපේක්ෂාවෙන් සිටින අයගේ එම අපේක්ෂා ඉටුවන අතර නව ප්‍රේම සබඳතාදියට අවශ්‍ය මග පැදේ. දරුවන්ගේ දියුණුව අපේක්ෂා කළ හැකි වසරකි. රැකියා අපේක්ෂාවෙන් සිටින අයගේ එම අපේක්ෂා ඉටුවන අතර උසස් අධ්‍යාපනයට යොමුවීමට ද හොඳ වසරකි. ඒ සඳහා අවශ්‍ය පසුබිම පහසුවෙන් සකසා ගත හැක.

නොයෙකුත් බාධක හා කම්කටොලු චිත්ත පීඩාදිය මෙම වසරේ උදාවෙන නමුත් ඒවා මැඩලා ඉදිරියට යා හැක. ගුරු මහ දශාව අතුරු දශාව ගෙවන අයට සුබදායක වන අතර ශනි මහ දශාව අතුරු දශාව ගෙවන අයට මිශ්‍රඵල දායකය.

කටක ලග්නය



ලග්නාධිපති සඳු කුජ හා කේතු සමග පස්වැන්නේ ද රවි හා සිකුරු හය වැන්නේද බුධ හා ශනි හත්වැන්නේත් ගුරු අට වැන්නේත් රාහු එකොළොස්වැන්නේත් සිටිය දී කටක ලග්නයෙන් උපන් ඔබට නව වසර උදාවෙයි.

වෙනදාට වඩා ආදායම් තත්ත්වයේ ඉහළ යෑමක් මේ මේ වසරේ අපේක්ෂා කළ හැක. ව්‍යාපාරික කටයුතු හා වෙනත් මාර්ගවලින් වෙනදාට වඩා යහපත් ප්‍රතිචාර මේ වසරේ ඔබට හිමි වනු ඇත. දරුවන්ගේ ප්‍රශ්න වෙනුවෙන් වෙනදාට වඩා වෙහෙසෙන්නට සිදුවෙයි. ගෝ දොර ඉඩ කඩම් යාන වාහන ආදිය පිළිබඳව අලුතින් ගොඩ නැගීමට මිළදී ගැනීමට අදහස් කරන්නේ නම් එය තරමක් කල් දැමීම සුදුසුය.

ප්‍රේම සබඳතා බිඳවැටීම් විවාහ ප්‍රමාදවීම් ආදිය නිසා සිත් තැවුලට පත්වීමට ඉඩ ඇති බැවින් කල්පනාවෙන් කටයුතු කරන්න.

රැකී රක්ෂා ආදියෙන් සැලකිය යුතු දියුණුවක් අපේක්ෂා කළ නොහැක. ඒ පිළිබඳ සිත් තැවුල් පසුබෑම් ආදිය සිදුවෙයි. හිතමිත්‍රාදීන් සමග කටයුතු කිරීමේදී ඉතා ප්‍රවේසම් විය යුතු කාලයකි.

උපතේ දී සඳු ඔබේ කේන්ද්‍රයේ හය හත සහ අට යන රාශිවල ගමන් කළේ නම් ඒ අයට මෙම වසර අසුභ ඵල වැඩියෙන් ලැබෙන වසරකි.

7 වැනි පිටුවට..

6 වැනි පිටුවෙන්..

සිංහ ලග්නය



ලග්නාධිපති රවි සිකුරු සමග පස්වැන්නේද සඳු කුජ සහ කේතු සිවුවැන්නේද බුධ ශනි හය වැන්නේද ගුරු හත්වැන්නේ සහ රාහු දසවැන්නේ සිටියදී සිංහ ලග්න හිමියාට නව වසර උදාවෙයි.

ලග්නාධිපති හා කර්මස්ථානාධිපති ගේ යෝගය ත්‍රිකෝණ ගතවීම යහපත් පිහිටීමකි. රැකියා අංශයේ දියුණුව අපේක්ෂා කළ හැක. රැකියාවේ උසස් වීම් බලාපොරොත්තු විය හැක. එසේම ස්ථාන මාරුවීම් රැකියා වෙනස් කිරීම් ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම හා රැකියාව වෙනත් මගකට යොමු කිරීමට සිත පෙළඹෙයි. වෘත්තිය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා කෙටි උත්සාහයකින් වැඩියමක් ලබා ගත හැක.

ගෘහ ජීවිතයේ කරදරකාරී ස්වභාවයක් ඇති කරයි. මව් පාර්ශ්වයේ යහපත් ප්‍රතිඵල නොලැබේ. මවට අපල කාලයකි. ගේ දොර ඉඩකඩම් යාන වාහන අංශයෙන් පාඩු සිදුවෙයි.

ප්‍රේම සබධතා විවාහ යෝජනා සඵල වන නමුදු විවාහයට බාධා පමුණුවයි. දරුවන්ගේ දියුණුව අපේක්ෂා කළ හැකි වසරකි. අධ්‍යාපන කටයුතු යහපත් වන අතර විදෙස් ගමන් දුර ගමන් අපේක්ෂාවෙන් සිටි අයට ඒවා සපල කරගත හැක. රවි කුජ දශා අතුරු දශා ගෙවන අයට යහපත් වන අතර උපතේදී සඳු පහ හය හත යන රාශිවල ගමන් කළ ජන්මීන්ට මෙම කාලය එතරම් යහපත් නොවේ.

කන්‍යා ලග්නය



ලග්නාධිපති බුධ ශනි සමග පස්වැන්නේ ද සඳු කුජ සහ කේතු තුන් වැන්නේද රවි සිකුරු සිවුවැන්නේද ගුරු හය වැන්නේද රාහු නව වැන්නේද සිටිය දී කන්‍යා ලග්න හිමියාට නව වසර උදාවෙයි.

අධ්‍යාපන කටයුතු වලට යහපත් වර්ෂයක් වන අතර දූ දරුවන් සිටිනම් ඔවුන්ගේ දියුණුවද අපේක්ෂා කළ හැකි වසරකි. ගේ දොර ඉඩකඩම් යාන වාහන ආදිය ලැබීමට භාග්‍ය ඇති වසරකි. සහෝදරාදීන් ගෙන් කරදර ඇතිවන අතර මෙම වසර මවට පියාට එතරම් හොඳ මදිය. විවාහ කටයුතු වලට බාධා පමුණුවන වසරක් වේ.

රැකියා අංශයේ දියුණුව ඇති කරයි. උසස්වීම් බලාපොරොත්තු විය හැකිවා මෙන්ම ස්ථාන මාරුවීම් රැකියාව වෙනස් කිරීම් ආදියද සිදුවෙයි. දුර ගමන් මෙන්ම විදෙස් රැකියා හෝ විදෙස් සංචාර අපේක්ෂාවෙන් සිටියේ නම් ඒ සඳහා අවස්ථාව ලැබේ.

ආදායම් මාර්ගවලට බාධා පමුණු වන අතර ඒ ගැන සතුටු විය නොහැක. පෙර සිටි මිතුරු මිතුරියන් ගෙන් යම් තරමකට හෝ දුරස්වීමට ඇති ඉඩකඩ වැඩිය. උපතේදී සඳු හතර පහ හය යන රාශිවල සිටිය දී උපන් ජන්මීන්ට මෙම කාලය සුබ කාලයක් නොවේ.

තුලා ලග්නය



ලග්නාධිපති සිකුරු රවි සමග යෝග වී තුන් වැන්නේද සඳු කුජ සහ කේතු දෙවැන්නේ ද බුධ ශනි සිවුවැන්නේ ද ගුරු පස්වැන්නේ ද රාහු අටවැන්නේ ද සිටිය දී තුලා ලග්න හිමියාට නව වසර උදාවෙයි.

ගුරු ග්‍රහයා මූල ත්‍රිකෝණයට පස්වැන්නට පැමිණ සිටින හෙයින් අධ්‍යාපන කටයුතු වලට යහපත් වර්ෂයකි. එසේම දරුවන්ගේ දියුණුව අපේක්ෂා කළ හැක. ගේ දොර ඉඩකඩම් යාන වාහන ආදිය සම්බන්ධයෙන් නව බලාපොරොත්තු තබාගන්නා වර්ෂයකි.

ආදායම් පැත්ත කෙසේ වෙතත් තැන්පත් ධනයක් වේ නම් එම මුදල් වැය වීමට අවශ්‍ය කරුණු මෙම වර්ෂයේදී යෙදෙන බැවින් ඒ පිළිබඳව සැලකිළිමත් වන්න.

රැකියා අංශයේ දියුණුව අපේක්ෂා කළ හැකි වසරක් නොවේ. රැකියා අංශයේ බාධක කරදර බොහෝමයක් පැන නගින වර්ෂයක් බැවින් ඉතාම ප්‍රවේශමෙන් හා කල්පනාවෙන් කටයුතු කළ යුතු කාලයකි.

බුධ ශනි ගුරු අතුරු දශා ගෙවන අයට මෙම වර්ෂය සුබවන අතර සඳු රාහු දශා අතුරු දශා ගෙවන අයට තරමක් අපල කාලයකි.

වෘශ්චික ලග්නය



ලග්නාධිපති කුජ සඳු හා කේතු සමග ලග්නයේත් රවි හා සිකුරු දෙවැන්නේත් බුධ හා ශනි තුන්වැන්නේත් ගුරු සිවුවැන්නේත් රාහු හත්වැන්නේත් සිටියදී වෘශ්චික ලග්න හිමියාට නව වසර උදාවෙයි.

ගෙවුනු වසරට වඩා යහපත් තත්ත්වයක් අපේක්ෂා කළ හැකි වසරකි. ආර්ථික වශයෙන් වෙනදාට වඩා යම් දියුණුවක් ඇතිවෙයි. ගේ දොර ඉඩකඩම් යාන වාහන මිලදී ගැනීම නිවාස ඉදිකිරීම් හෝ අලුත්වැඩියා ආදියට සිත යොමු වෙයි. ඒවා යම් ප්‍රමාණයකින් ඉටුකර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබේ.

දරුවන්ගේ දියුණුව සම්බන්ධයෙන් කටයුතු සිදුවෙයි. විවාහ අපේක්ෂිතයින්ගේ අරමුණු යම් බාධාවන් මධ්‍යයේ වුවද සිදුවෙයි.

රැකියා අංශයේ දියුණුව අපේක්ෂා කළ හැක. රැකියාවේ උසස්වීම් ස්ථාන මාරු රැකියා වෙනස්වීම් සිදුවීමට පුලුවන. රැකියා අපේක්ෂිතයින් ගේ අරමුණු ඉටුවෙයි. උසස් මිතුරන්ද නව මිත්‍ර සබඳතා ද ගොඩ නැගෙන වර්ෂයකි. සඳු ගුරු දශා අතුරු දශා ගෙවන අයට වඩාත් යහපත් සුබඵල ලැබෙනු ඇත.

ධනු ලග්නය



ලග්නාධිපති ගුරු තුන්වැන්නේත් රවි හා සිකුරු ලග්නයේත් බුධ ශනි දෙවැන්නේත් රාහු හය වැන්නේත් සඳු කුජ හා කේතු දොළොස්වැන්නේත් සිටියදී ධනු ලග්න හිමියාට නව වසර උදාවෙයි.

සුභා සුභ මිශ්‍රව ගෙවී යන මෙම වර්ෂය ගෙවුණ වසරට සාපේක්ෂව යම් සුබඵලදායක බවත් ධනු ලග්න හිමියාට අපේක්ෂා කළ හැක. ආදායම් තත්ත්වයේ ඉහළ යෑමක් පෙන්නුම් කරන අතර විනෝද ගමන් ප්‍රිය සම්භාෂණ මෙම වසරේ ඔබට වැඩිපුර ලැබේ.

විවාහ අපේක්ෂිතයින්ගේ අරමුණු ඉටුවන අතර අවිවාහකයින්ට මංගල සීනු නැඬවේ. දරුවන්ගේ දියුණුවත් දුර ගමන් විදේශ ගමන් ආදිය සඵල වන වසරකි. රැකියා අපේක්ෂිතයින්ගේ අරමුණු ඉටුවන අතර රැකියා අංශයේ දියුණුව ඇති කරයි.

උසස් හිත මිත්‍රාදීන් හමුවන වසරක් මෙන්ම ඔවුන්ගෙන් උදව් උපකාරද හිමිවන වසරකි. නඩු හබ හදිසි අනතුරු රෝහල් ගතවීම් ආදියට ඇති ඉඩකඩ වැඩි බැවින් ඒ පිළිබඳව සැලකිලි මත් වන්න. රවි බුධ සහ සිකුරු දශා අතුරු දශා ගෙවන අයට සුබ ඵල වැඩි වන වර්ෂයකි.

මකර ලග්නය



ලග්නාධිපති ශනි බුධ සමග ලග්නයේද දෙවැන්නේ ගුරු ද පස්වැන්නේ රාහු ද සඳු කුජ කේතු එකොළොස්වැන්නේද රවි හා සිකුරු දොළොස්වැන්නේද සිටියදී මකර ලග්න හිමියාට නව වසර උදාවෙයි.

ගෙවුණු වසරට වඩා ලැබූ වසර ගැන සතුටු විය හැකි වසරක් වනු ඇත. ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව මතු දියුණුව සඳහා යම් වැඩකට අත ගැසීමට සුබ නව වසරකි. ආදායම් තත්වයේ දියුණුවක් අපේක්ෂා කළ හැක.

භූමියෙන් ලබා ගන්නා සම්පත් වැඩිදියුණු කර ගත හැක. ඉඩම් ලාභ නිවාස ලාභ පෙන්නුම් කරයි. යාන වාහන මිල දී ගැනීමට අපේක්ෂා කරන්නේ නම් අදහස් සඵල වේ.

ප්‍රේම සබඳතා විවාහ කටයුතු සඳහා ඉඩකඩ ලැබෙන නමුදු ඒවාට විවිධ වූ බාධා පැමිණෙයි. අඹුසැමි ආරවුල් හට ගැනීමට ඉඩ ඇත. රැකියා අංශයේ දියුණුව අපේක්ෂා කළ නොහැක. ස්ථාන මාරුවීම් රැකියා අහිමිවීම් වෙනත් රැකියාවලට මාරුවීම් සිදුවීම ආදිය සිදුවිය හැක.

විවිධාකාර චරිත ස්වභාවයේ අය හමුවන මෙම වසරේ ඔබ ඔවුන්ගෙන් ප්‍රවේශම් නොවුවොත් විවිධ කරදරවලට පත්වීමට සිදුවෙයි. ශනි කුජ බුධ මහා දශා අතුරු දශා ගෙවන අයට මෙම වසරේ සුබඵල වැඩියෙන් ලැබෙනු ඇත.

කුම්භ ලග්නය



ලග්නාධිපති ශනි, බුධ සමග දොළොස්වැන්නේ ද ගුරු ලග්නයේ ද සිවුවැන්නේ රාහු ද සඳු කුජ හා කේතු දසවැන්නේ ද රවි හ සිකුරු එකොළොස්වැන්නේ ද සිටිය දී කුම්බ ලග්න හිමියාට නව වසර උදාවෙයි.

උසස් හිත මිත්‍රාදීන් රැසක් හමුවන හා අලුත් මිතුරු මිතුරියන් ඇසුරට ලැබෙන ආදායම් මට්ටම ඉහළ යන එමෙන්ම වියදමද වෙනදාට වඩා වැඩිවන නව වසරකි.

රැකී රක්ෂා හා රැකියාවේ දියුණුව අපේක්ෂා කළේ නම් එය ඉටුවීමේ ලකුණු පහළ වනු ඇත. යම් යම් ව්‍යාපාර කටයුතු වලට අවධානය යොමුකර සිටියේ නම් ඒ සඳහා දැන් හොඳ අවස්ථාවකි.

විවාහාපේක්ෂාවෙන් සිටින තරුණ තරුණියන්ගේ අදහස් මල්ඵල ගැන්වෙන වසරකි. විදේශගතවීමට හෝ දුර බැහැර ගමන් යාමට හෝ පදිංචිය වෙනස් කිරීමට අපේක්ෂා කරන අයගේ අදහස් ඉටුවෙයි.

ගුරු කුජ සිකුරු මහා දශා අතුරු දශා ලබා ඇති අයට මේ වසරේ බොහෝ සුබ ඵල ලැබෙනු ඇත.

මීන ලග්නය



ලග්නාධිපති ගුරු දොළොස් වැන්නේද රාහු තුන්වැන්නේද නව වැන්නේ සඳු කුජ හා කේතු ද රවි හා ශුක්‍ර දස වැන්නේද බුධ හා ශනි එකොළොස්වැන්නේ ද සිටිය දී මීන ලග්න හිමියාට නව වසර උදාවෙයි.

පෙර වසරට වඩා උද්යෝගයෙන් හා උනන්දුවෙන් යුතුව කාර්ය බුහලව කටයුතු කිරීමට සිදුවන වසරකි. ආදායම් තත්ත්වයේ වෙනසක් නොවුණත් ණය නොවී සිටීමට භාග්‍ය ඇත. ගේ දොර ඉඩ කඩම් වල ගුණාත්මක වෙනසක් සිදුවෙයි.

පුත්‍රකාරක සඳු නීච වී සුවක්ෂේත්‍ර කුජ සමග නව වැන්නේ සිටින්නේ කේතු සමගය. දරුවන් වෙනුවෙන් වෙහෙසවීමට සිදුවන්නේ වෙනදාට වැඩියෙනි.

රැකියා කටයුතු කෙරෙහි තෘප්තිමත් නොවේ. ගුණාත්මක වෙනසක් නොවුණත් කෙසේ හෝ දරාගෙන යෑමට සිදුවෙයි. බාධා කරදර මධ්‍යයේ වුවද විවාහ අපේක්ෂකයින්ගේ අපේක්ෂා ඉටුවන වසරකි. උසස් හිතමිතුරන් ගේ උදව් උපකාර ලැබෙන වසරකි. සඳු කුජ කේතු දශා අතුරු දශා ගෙවන්නන්ට මෙම වසරේ සුබඵල වැඩියෙන් ලැබෙනු ඇත.

ලයනල් ප්‍රේමකුමාර

ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.

ඩුබායි කටාර් කුවේට් ඕමාන්

සවුදි ලන්ඩන් පැරිස් කැනඩා

ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...

වැඩි විස්තර සඳහා අමතන්න...

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම,
450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
දුරකථන : 011-2689500-8

M - 077-2672970
077-3572835
077-3561210
E - csltravels@sltnet.lk

CSL TRAVELS

IATA ACCREDITED AGENT

අහස උසට යන බඩු මිල

කොරෝනා වසංගතය ආරම්භයත් සමග චීනය මුලින්ම තම රටේ ප්‍රාන්ත කීපයත් ලොක්ඩවුන් කිරීම ආරම්භ කළේය. අනතුරුව රටම ලොක්ඩවුන් විය. වසංගතය ලොව පුරා ආක්‍රමණය කරද්දී තම තමන් රටවල් වසා දැමිනි. වසංගතය ආරම්භ වී මාස දෙක තුනක් යන විට නොවැසුන රටක් නොවීය.

මෙසේ රටවල් වැසීම ආරම්භයත් සමග නිෂ්පාදනය අඩුවන්නට විය. රටක් වැසීම යනු නිවසක් වසනවා වැනි කටයුත්තක් නොවේ. ඊට වඩා සංකීර්ණ භාර දූර බැරෑරුම් කටයුත්තකි. කොරෝනා ආරම්භයේ දී රටවල් වැසීමෙන් ඊළගට සිදුවන අනතුර ගැන අප පැහැදිලිව කරුණු කීවෙමු. ඒ කියූ දෙය ටිකෙන් ටික ඉටුවන බව ඇස් පනා පිට ඉතා කෙටි කාලයකින් සිදුවෙමින් පවතී. විශේෂයෙන් විරැකියාව මූල්‍ය හිඟතාව උද්ධමනය බඩුමිළ ඉහළ යෑම ප්‍රධාන වෙයි. එය කිසිඳු ජගතෙකුට නැවැත්විය හැක්කක් නොවේ.

ඒවායේ අතුරු විපාක අප වැනි රටවලට සිදුවන බලපෑම් ඉතා ඉහළය. කුමන කාලයක වුණත් බලවතා දුර්වල වන්නේ හිම්හිටය. දුබලයින් ඉක්මනින් අකර්මන්‍ය වෙයි. මේ සිදුවෙමින් පවතින්නේ එයයි.

චීනයේ කර්මාන්ත ශාලා වැසී යන විට ජපානය දකුණු කොරියාව වැනි කාර්මිකකරණයේ ඉහළට ගිය රටවලද කර්මාන්ත ශාලා වැසී ගියහ. අද වන විට රටවල් පෙර මෙන් හුදකලා වී නොමැත. එකිනෙකා සැම අතින්ම බැඳී පවතියි. දම්වැලක පුරුක් මෙනි. රටවල් ලොක්ඩවුන් වීම යනු දම්වැලේ පුරුක් ගැලවී බන්ධනය වෙන්වීමකි. තොරතුරු තාක්ෂණය ඔස්සේ බැඳී තිබෙන බන්ධනය ආර්ථිකය විසින් දරා සිටියි. ලෝකය පුරා මුදල් සංසරණය සිදුවෙයි. මෙයින් එක් රටක් හෝ ගිලිහී ගිය හොත් ආර්ථික බන්ධනය බිඳී යති.

මේ නිසා ඇති වන භාණ්ඩ හිඟය හේතුවෙන් ලොව පුරා භාණ්ඩ හිඟයක් හා මිළ ඉහළ යෑමක් සිදුවී ඇත.

තවද සංචරණ සීමා පැනවීම හේතුවෙන් හා හුදකලා කිරීම හේතුවෙන් කොරෝනා නිසා සිදුවූයේ එයයි.

මෙම බිඳීයෑම හේතුවෙන් සැම රටක්ම හුදකලා තත්වයට පත් විය. තමා සන්තකයේ පමණක් ඇති වත්කම මත යැපීමට සැම රටකටම සිදුවෙයි. ඒ අතරින් යහමින් මුදල් නිෂ්පාදන හා සංචිත ඇති රටවල් යම් පමණකට ඔරොත්තු දෙන අතර අනුන් මත යැපෙන අපි වැනි රටවල් අන්ත අසරණ භාවයට පත්වී සිටිති.

මේ තත්ත්වය රටක් වශයෙන්ද පමණක් නොව පවුල් ඒකකයක් ලෙස ද ගත් කළ ඇති වී ඇති පොදු ධර්මතාවයකි. යහමින් වී හාල් පොල් ඇතුලු කෘෂි ආර්ථිකයෙන් පොහොසත් පිරිස් වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිය. මූල්‍ය ශක්තිය පමණක් ඇති නාගරික හා අර්ධ නාගරික ජනයාට මුදල් තිබුණද භාණ්ඩ හිඟවීමේ දුස්කරතාවට මුහුණ දීමට සිදුවී ඇත. රටවල් වශයෙන්ද පවුල් වශයෙන්ද තමා සතු නිෂ්පාදන සංචිත වශයෙන් ඉතිරි කර ගැනීමට හැමවිටම උත්සාහ කරයි. ඒ හේතුව නිසාත් වසංගතය හේතුවෙන් කර්මාන්ත වැසී යෑම ශ්‍රමිකයින් නිවෙස්වලට ගාල්වීම හේතුවෙන්ද භාණ්ඩ නිෂ්පාදය අඩුවෙයි.

මූල්‍ය සංචරණය සීමා වීම යන කරුණු නිසා ජාත්‍යන්තර මුදල් හුවමාරුව නවතින අතර රටින් රට ගනුදෙනු කිරීමේ හැකියාව නැවතී ගොස් ඇත. මේ හේතුව නිසා ආනයන කටයුතු සිදු කිරීම අපහසුවන අතර අපනයන ඉල්ලුම පහළ බසී. මේ තත්ත්වය හේතුවෙන් භාණ්ඩ හිඟවීමත් ඉල්ලුම වැඩිවීමත් මිල ඉහළ යෑමත් කිසිවෙකුට වැළැක්විය නොහැකි කරුණකි.

මෙම න්‍යාය එසේ වුවත් ජනතාවගේ මූලික අවශ්‍යතාවන් එළෙසම පවතී. ඒවා අඩුවීමක් නැත. ඊට අමතරව මෙම තත්ත්වයට මූලික හේතුව බවට පත්වූ වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වන සෞඛ්‍ය වියදම සීඝ්‍රලෙස ඉහළ ගොස් ඇත. එය අමතර වියදමක් බවට පත්වී ඇත. එය අනිවාර්යෙන් දැරිය යුතු වියදමකි. ඊටත් අමතරව ස්වාභාවික විපත් ජල ගැලීම් කඳු නාය යෑම් හදිසි අනතුරු විපත් මෙම කාලය තුළ ලොව පුරා සීග්‍රයෙන් වැඩි වී ඇත. මේ තත්ත්වයන් වලටද ජනතාව මුහුණ දිය යුතුව ඇත. මේ සියල්ලකින් සිදුවන්නේ නිෂ්පාදනය පහළ බැසීම ඉල්ලුම වැඩිවීම මූල්‍ය හිඟතාව ආදී ආර්ථික විෂමතාය.

මෙම සියලු තත්වයන් වලට හේතුව වන්නේ වැරදි මිනිස් චර්යාවන් බව පැහැදිලිය. ස්වාභාවික විපත් හා වසංගත තත්ත්වයන්ට මිනිස් චර්යාවන් මෙන්ම තවත් හේතු රාශියක් බලපාන නමුත් ආර්ථික දරිද්‍රතාව හා ජීවත්වීමේ දුෂ්කරතාව රටවල් විසින් ගන්නා වූ දේශපාලන ආර්ථික සාමාජීය තීන්දු තීරණ වල දීර්ඝ කාලීන ප්‍රතිඵලයන් වශයෙන් රටින් රටට වෙනස් වෙයි. පුද්ගල ඒකක හෝ පවුල් ඒකක වශයෙන් ගත් කළ ඒ ඒ පුද්ගලයා හෝ ඒ ඒ පවුල් වශයෙන් දීර්ග කාලයක් ගෙන ආ ආර්ථික හැඩ ගැසීමට අනුකූලව දරිද්‍රතාව හා දිළිඳුකම ඇති වී ඇත. නමුත් රටක් වශයෙන් ගනු ලබන තීන්දු තීරන දීර්ග කාලයක් වැරදී ගොස් ඇත්නම් තනි තනි පුද්ගලයින් වශයෙන් ශක්තිමත්වී සිටියද ඔවුන් අසරණ වන අවස්ථාවක් උදාවනු ඇත.

ඉතිහාසය පුරා අපි ගත් තීන්දු වැරදී ගොස් ඇති බව වර්තමානය වන විට බොහෝ දෙනෙකු තේරුම් ගෙන ඇතත් මේ මොහොතේ ඒවා නිවැරදි කිරීමට යෑමෙන් තව තවත් අතුරු ප්‍රශ්න රැසකට රටක් ජනතාවක් වශයෙන් ගොදුරු වනු ඇත.

මූල්‍ය ආර්ථිකය මත පමණක් යැපෙන නාගරික හා අර්ධ නාගරික ජනයාට සිය මූලික අවශ්‍යතාවයන් මුදලින්ම පමණක් ලබා ගන්නේ නම් හතර දෙනෙකුගෙන් යුත් පවුලකට මසකට රු. 50,000 ක් පමණ මුදලක් වැය කිරීමට සිදු වී ඇත. මූල්‍ය ශක්තිය ඇති මුත් භාණ්ඩවල හිඟය නිසා පවතින දුෂ්කරතාවට ඔහුටත් මුහුණ දීමට සිදුවෙයි.

ලෝක වෙළෙඳ පොළේ ගෑස් නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් මිල ඉහල යෑමත් විදේශ භාණ්ඩ ගෙන්වීමට රටට ජාත්‍යන්තර මුදල් නොපැමිණීමත් නිසා දේශීය වෙළෙඳ පොළේ ගෑස් හිඟතාවයක් ඇති වන විට දර ලිපෙන් ඉවත්වූ මධ්‍යම පාංතික හා නාගරික වැසියාට ගෑස් ලබාගැනීමට පෝලිමේ සිටීමට සිදුවීම පුදුමයක් නොවේ.

සාමාන්‍ය ගමනාග මනය මෝටර් රථයකට හුරුකර ගත් ජනතාවට පෝලිමේ ගොස් වැඩි මිලට තෙල් ලබාගැනීමට සිදුවීම ගැන අප පුදුම විය යුතු නොවේ. කිරිපිටි අත්‍යාවශ්‍ය ආහාරයක් කරගත් පසු එම අත්‍යාවශ්‍ය ආහාරය පෝලිමේ ගොස් වැඩිමිලට ලාබගැනීමට සිදුවීම අනිවාර්ය කටයුත්තකි.

මේවා මිනිස් ජීවිතයට අනිවාර්ය අංග බවට පත්වන විට රටක් වශයෙන් අපි අඩුම තරමේ වසරකට දෙකකට අවශ්‍ය සංචිත ප්‍රමාණයක් වත් නොතබා ගැනීමේ ඛේදවාචකය අද අප ඉදිරියේ ඇත.

රටක් වශයෙන්ද පුද්ගලයින් වශයෙන්ද පවුල් වශයෙන්ද වසර 40 ක් තිස්සේ අපි පුරුදු වී ඇත්තේ සියල්ල මිලදී ගැනීමටය. අද වන විට මිලදී ගැනීමට තැනක් ද මිලදී ගැනීමට මුදල් ද අපට නැත උපේක්ෂාවෙන් දරා ගැනීම හැර කෙටි කාලීන විසඳුම් ද මේ වන විට නැත.



දොළොස් වසරක් පුරා ISO ප්‍රමිති සහතිකයෙන් පිදුම් ලබන

සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානය

ලොව පුරා විහිදී ඇති ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය හෙවත් **ISO** ආයතනය ලොව සෑම රටක්ම පිළිගත් ආයතනයකි. මෙම ආයතනය මගින් සිදුකරන්නේ ලොව ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීමයි. මෙම ආයතනය මගින් ප්‍රමිති සහතිකය දිනා ගැනීම සුළුපටු කාර්යයක් නොවේ. එවැනි ආයතනයන්හි ඉහළ කළමනාකාරිත්වයේ සිට පහළම සේවකයා දක්වා තම තමන්ගේ කාර්යභාරය පමණක් නොව ලිපි ලේඛන පවා ජාත්‍යන්තර මට්ටමින් ලොව පිළිගත් පිළිවෙළට පවත්වාගන යායුතුය.

මේ සියලු අංශයන් නිසි පරිදි ඉටුකිරීම පිළිබඳ දීර්ඝ විමර්ශනයකින් පසු 2009 වසරේදී සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාශන ආයතනයට **ISO** ප්‍රමිති සහතිකය හිමිවිය.

එම සහතිකය ප්‍රකාරව තත්ත්ව පාලන ප්‍රතිපත්තියක් හා දැක්මක් ප්‍රකාශයට පත්වී ඇත. ඒ අනුව අපගේ තත්ව ප්‍රතිපත්තිය නම් අපගේ පාරිභෝගිකයින් ගේ හා සේවාලාභීන්ගේ අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන්ට ගෙවන මුදලට සරිලන කාර්යක්ෂම උසස් තත්වයේ සේවාවක් ලබාදෙමින් දේශීය හා විදේශීය වෙළඳපලේ කීර්තිය දිනා ගත් මගී ගමන් බඩු නිශ්කාශන හා ගුදම් ගත සේවාවක් ජාත්‍යන්තර අනර්ඝතම මට්ටමට අනුව පවත්වාගෙන යාම අපගේ ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

පාරිභෝගික තෘප්තිය හා නිරන්තර වැඩිදියුණුව ඇතිකරමින් පද්ධතිය තුළ මනා තත්ව කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර නිවැරදි කිරීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියා මාර්ග මගින් තත්ව පද්ධතියේ කාර්යක්ෂමතාවය නිරන්තරව වැඩි දියුණු කරනු ලබන අතර අභ්‍යන්තර හා බාහිර විගණනය නිරන්තරව සිදුවෙයි.

තත්ව ප්‍රතිපත්තියට අමතර තවත් ප්‍රධාන අරමුණු තුනක් ඇත. එනම්

1. භාණ්ඩ හැසිරවීමේදී සිදුවන හානිය 2.5% දක්වා අඩු විය යුතුය. එනම් පාරිභෝගිකයාගේ භාණ්ඩ සඳහා 97.05% ක ආරක්ෂාවක් සහතික විය යුතුය. ඉතාමත් පරිස්සමින් හා ආරක්ෂාකාරී ලෙස කටයුතු කළයුතු වීම එක් ප්‍රධාන අරමුණකි.

2. පාරිභෝගිකයා සඳහා සිය සේවාවන් ඉටු කිරීමේදී ගතවන කාලය විනාඩි 9 ක තරම් සාමාන්‍ය අගයක් පවත්වාගත යුතුව ඇත. සිලෝක් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාෂන මධ්‍යස්ථානයට සේවා ලබා ගැනීමට එන ඔබට ඔබගේ භාණ්ඩ ඔබ අතට පත් වන විට ප්‍රධාන සේවා කවුළු තුනක් පසුකර යා යුතුය. ඒ ඒ ස්ථානවලදී අදාල රාජකාරී සිදුවෙයි. ඒ අනුව විනාඩි 30 ට අඩු කාලයකදී ඔබට සිය සේවාවන් ඉටුවනු ඇත.

3. පාරිභෝගි ක පැමිණිලි 5% දක්වා අඩුකර ගැනීම සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානයේ තවත් එක් ප්‍රධාන අරමුණකි.

ඔනෑම සේවා ස්ථානයකින් සේවා සැපයීමේදී පාරිභෝගිකයින් ගේ පැමිණිලි නිරන්තරයෙන් ලැබෙනු ඇත. එසේ වන්නේ ආයතනික දුර්වලතා හේතුවෙනි. එහෙත් **ISO** 9001:2015 තත්ත්ව සහතිකය යටතේ එවැනි අඩුපාඩු තබා ගත නොහැකි. එලෙස පාරිභෝගික පැමිණිලි 5% ට වඩා අඩුවෙන් තිබිය යුතුය. එසේ පවත්වාගෙන යෑමට කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් කටයුතු කරති.

එසේ ජාත්‍යන්තර පිළි ගැනීම ලැබීමෙන් පසුද එම තත්ත්වයෙන්ම සිදුවන්නේද යන්න ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය හරහා පසු විපරම් සිදු කරයි. වසර තුනකට වරක් මෙම සහතිකය නිකුත් කරන අතර එම කාලය තුළ ද වසරකට වරක් පූර්ණ අධීක්ෂණයට භාජනය කිරීම සිදුවෙයි. මීට අමතරව ආයතනය මගින් වෙනම කාර්ය මණ්ඩලයක් යටතේ අභ්‍යන්තර විගනනයක් නිරන්තරයෙන් සිදුකරති.

මෙවැනි කඩඉම් රැසක් පසුකර ලබා ගත් **ISO** 9001:2015 ප්‍රමිති සහතිකය ඊළඟ වසර සඳහාද රැක ගැනීමට නම් එම මට්ටමින්ම ආයතනය පවත්වාගෙන යෑම ආයතනයේ වගකීමයි.

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානය එළෙස අඛණ්ඩව වසර 12 ක් පුරාවට **ISO** ප්‍රමිති සහතිකය ලබාගත් ආයතනයක් වීම විශිෂ්ටය.

ප්‍රධාන වශයෙන් මෙම ආයතනයට පැමිණෙන්නේ විදේශගත වූ ලාංකිකයින් එම රටින් ලංකාවට ගෙන ආ බඩු භාණ්ඩ නිදහස් කරගැනීම උදෙසාය.

ඒ පිරිස් අතර තම භාණ්ඩ නිදහස් කරගැනීම පිළිබඳ අවබෝධය ඇති අයත් නැති අයත් සිටිති. මේ සැමටම එක සමාන ලෙස සේවා සහ පහසුකම් සැපයීම ආයතනයේ හා සේවක සේවිකාවන්ගේ වගකීම හා යුතුකම වනු ඇත.

පළමුව මෙම ස්ථානයට පැමිණෙන සේවාලාභියාට අනු පිළිවෙලින් අංකයක් ලැබෙන අතර ඒ අයගේ විදේශ ගමන් බලපත්‍රය හා අදාළ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතනික සේවක සේවිකාවන් අතින් ඉතිරි රාජකාරී සියල්ල සිදුවෙයි.

අදාළ පත්‍රිකා පුරවා තමාට අයත් භාණ්ඩ හෝ බඩු පෙට්ටි නිසි ලෙස හඳුනාගැනීම සිදුකිරීමෙන් අනතුරුව භාණ්ඩ නිදහස් කරගැනීමේ ලේඛනය අදාළ පුද්ගලයා වෙත ලැබෙනු ඇත. මේ සඳහා ගතවන උපරිම කාලය විනාඩි 30 ක් තරම් කෙටි කාලයකි.

විදේශ රටක සිට එන භාණ්ඩ පෙට්ටි දහස් ගණනක්, සේවාලාභීන් දහස් ගණනක් අතුරින් තම භාණ්ඩ නිසි ලෙස හඳුනාගෙන නිසි ආරක්ෂාව යටතේ නීත්‍යානුකූල ලියවිලි රැසක් නිසි ප්‍රමිතියට සකස් කොට සේවාලාභියා ගේ මූලික අවශ්‍යතාව විනාඩි 30 තරම් කෙටි කාලයකින් ලබාදීම යනු සුළු පටු කාර්යක් නොවේ. මෙම කාලය තුළ සිදුවන සියලු ක්‍රියා කාරකම් සඳහා සේවාලාභියා කිසිඳු වෙහෙසකට පත්වීමට ඉඩ නැත. ඔහුට ඇත්තේ නම සහ අංකය කියා අමතන තෙක් බලා සිටීම පමණි.

ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සේවාලාභියාට උපරිම සේවාවක් ලබාදීම තුළ සැමවිටම සිදුවන්නේ සේවාලාභියාගේ අවශ්‍යතාව ඉතා ඉක්මනින් හා නිවැරදිව ඉටුකර දීමයි.

ඊළඟට සේවාලාභියා ගේ භාණ්ඩ සඳහා ආයතනය පූර්ණ ආරක්ෂාව සළසයි. යම් විදියකින් කුමන හෝ කැඩීමක් බිඳීමක් හානියක් සිදුවී ඇත්නම් ඒ සඳහා රක්ෂණ ආයතනයේ නීති හා රෙගුලාසිවලට යටත්ව පූර්ණ රක්ෂනාවරණයක් හිමි වනු ඇත. තමා ඉදිරිපිට සියලු භාණ්ඩ රේගු පරීක්ෂාවට ලක්වන අතර එවැනි හානි පැමිණිළි යම් භාණ්ඩ ඇත්නම් ඒ ගැන එම අවස්ථාවේදීම පැමිණිලි කළ යුතුය.

සේවාලාභියා කුමන හෝ ආපහසුතාවකට පත් නොවන අයුරින් සියලු සේවාවන් ඉටුකර දීමේ පූර්ණ වගකීමෙන් යුක්තව කටයුතු කිරීම සිලෝන් ෂිපිං ලයින්ස් සමාගමේ පරමාදර්ශය වන අතර ඒ නිසාම අඛණ්ඩව **ISO** 9001:2015 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය මගින් පෙන්නුම් කරන ප්‍රමිතිය පවත්වා ගැනීම සිදුකරයි. ලොව කොතනක හෝ රටකදී ඉතා උසස් තත්ත්වයේ භාණ්ඩ නිශ්කාශන ආයතනයකට ඔබ ගිය ද එම තැනකින් ලැබෙන උපරිම සේවාව ඔබට ශ්‍රී ලංකාවේදී සිලෝන් ෂිපිං ලයින්ස් භාණ්ඩ නිශ්කාශන මධ්‍යස්ථානයේ දීද හිමි වනු ඇත.

දැනට ලංකාවේ ඇති **ISO** සම්මානය දිනාගත් එකම භාණ්ඩ නිශ්කාශන සමාගම බවට පත්වී ඇත්තේද සිලෝන් ෂිපිං ලයින්ස් නිශ්කාෂන මධ්‍යස්ථානයයි.

ආණ්ඩුව දන ගැස්සෙන ගොවි උද්ඝෝෂණ

ගසෙන් ගෙඩි එන්නා සේ පලිබෝධ නාශක හා රසායනික පොහොර ලංකාවට ගෙන ඒම තහනම් කරමින් රජය මගින් පසුගියදා අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කළේය. පාරිභෝගිකයින් වශයෙන් සමස්ත ජනතාවම වස විෂ නැති ආහාර සඳහා සියයට සියයක් එකඟවුවත් ගොවීන් අතරින් තැනින් තැන කසු කුසු සිදුවිය.

මෙම නියෝගය ආරම්භයත් සමග ගොවීන් ඉල්ලා සිටියේ අපට කුමන හෝ පොහොරක් ලබා දෙන ලෙසය. ඒ සඳහා රජය කටයුතු කළේ කාබනික පොහොර නිෂ්පාදනය කරගන්නා ලෙසත් ඒ සඳහා හෙක්ටයාර එකක් සඳහා රු. 12500/- ක් ලබා දෙන බවත්ය.

මෙම ක්‍රියාවලිය පිළිබඳව රජයට හෝ නිලධාරීන්ටත් ගොවීන්ටත් නිසි වැඩ පිළිවෙලක් නොතිබුණි. මෙම තීන්දුව ගැනීමට පෙර මේ පිළිබඳව නිසි කතිකාවතක් ද රට තුළ නොතිබුණි. කාබනික පොහොර පිළිබඳව මතයක් ගොඩනැගූ දේශපාලන කතිකාවතක් තිබූ අතර කාබනික වගාව සිදුකරන ගොවි සංවිධාන කීපයක් ද තිබුණි. ඒ පිළිබඳව ද හරිහැටි අධ්‍යයනයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නොතිබුණි.

කාබනික පොහොර නිෂ්පාදනය හා පලිබෝධ නාශක දේශීය වශයෙන් විෂෙන් තොරව නිෂ්පාදනය කිරීම පිළිබඳව නිවැරදි විද්‍යාත්මක ක්‍රම සම්පාදනයක් හෝ වැඩ පිළිවෙළක් රට තුළ නොමැති අවස්ථාවක ගත් මෙම අත්තනෝමතික තීන්දුවට ගොවීන් ගෙන් දැඩි විරෝධය මතුවිය. එම විරෝධයට ආණ්ඩු විරෝධී බලවේග සහ රසායනික පොහොර සහ පලිබෝධ නාශක මගින් යැපෙන පිරිස් විසින් මේ වනවිට නායකත්වය ලබා දී ඇත.

කුමන පොහොරක් හෝ ලබා දියවු කියා උද්ඝෝෂණය ආරම්භ කළ ගොවි විරෝධතා අද වන විට රසායනික පොහොර දියව් යන සටන් පාඨය පෙර ට ගෙන ඇත.

ලංකාවේ ගොවිතැන බහුල ප්‍රදේශවල විශේෂයෙන් අනුරාධපුරය, පොළොන්නරුව අම්පාර ආදී දිස්ත්‍රික්කවල බහුලව ව්‍යාප්තව ඇති හඳුනා

නොගත් වකුගඩු රෝගය සෑම ගෙවල් පහකින් එකකම එක් අයෙකුට හෝ දෙන්නෙකුට වැළඳී ඇත. මෙම භයානක වූත් මාරාන්තික වූත් රෝගය පලිබෝධ හා රසායනික පොහොර මගින්ම සිදුවන බව නිශ්චිත වශයෙන් විද්‍යාගාරයක් තුළ පරීක්ෂණ පවත්වා සනාථ කර නොමැති වුවත් මෙය වැළඳීමට හේතුව මේ බවට ඕනෑ තරම් සාක්ෂි පවතී.

මේ හේතුව නිසා පලිබෝධ නාශක හා රසායනික පොහොර අවම කිරීම ශරීර සෞඛ්‍යයට මෙන්ම රජයේ ආර්ථිකයටද යහපත් ප්‍රතිපත්තියක් බව අවිවාදිතය. නමුත් අතිවිශාල ජනතාවක් යැපෙන්නේ ගොවිතැන මතය. ගොවිතැන නොමැතිනම් ආහාරද නොපවතී. කොපමන මුදල් තිබුණද මුදල් අනුබව කළ නොහැක. ඒ සඳහා කෘෂි නිෂ්පාදන තිබිය යුතුය. ඉතා සීරුවෙන් කළ යුතුව තිබූ ව්‍යාපාරයක් ක්ෂණිකව කිරීමට ගොස් ආණ්ඩුව අනාගත් බව නම් ඉතා පැහැදිලිය.

වකුගඩු රෝගියෙකුට මාසිකව රුපියල් 5000 ක් හා බෙහෙත් රජයෙන් නොමිලේ ලබා දෙයි. දෛනික බෙහෙත් වලට අමතරව නේවාසික ප්‍රතිකාර කිරීමටද වරින් වර සිදුවෙයි. මේ සඳහා අතිවිශාල ධනස්කන්ධයක් රජයට දැරීමට සිදුවෙයි. ඊට අමතරව කොරෝනා වසංගතය හේතුවෙන් රට දැවැන්ත ඩොලර් අර්බුධයකට මුහුණ දී ඇති අවධියක පොහොර සහ පලිබෝද නාශක ගෙන්වීම පහසු කාර්යක් නොවේ. ඊටත් අමතරව මේ වන විට ලෝක වෙළඳ පොලේ රසායනික පොහොර සහ රසායනික ද්‍රව්‍ය අතිවිශාල හිගයක් හා මිල ඉහළ යෑමත් සිදුවී ඇත. මෙම නිෂ්පාදන බහුතරයක් බොරතෙල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන වශයෙන් නිෂ්පාදනය වන ද්‍රව්‍යයන්ය. අධික පිරිවැයක් දරා සිදුකරන ගොවිතැනකින් අපි වැනි රටවල ගොවියාත් පාරිභෝගිකයාත් දෙදෙනාම අමාරුවේ වැටෙති.

ලංකාවේ රසායනික පොහොර භාවිතය සිදුවී

වසර 55 ක් තරම් කෙටි කාලයකි. මුල් යුගයේ ගොවියාට එයින් අත් මිදීමට නොහැකි මට්ටමට පත්වී ඇත. ඊට පෙර මෙම රට ගොවිතැනින් ස්වයං පෝෂිතව තිබුණේ කුමන පොහොරක් හේතුවෙන්ද යන්න සොයා බැලිය යුතුය. විශේෂයෙන් කෙටි කාලීන භෝග සඳහා ඉක්මන් වැඩීමට හා අස්වැන්න නෙලීමට කෘතිම යමක් ගසට ලබා දිය යුතුය. හරියට කුකුල් මස් නිෂ්පාදනය මෙනි. අස්වැන්න නෙලීමට දිනකට දෙකකට පෙරද රසායනික ද්‍රව්‍ය භෝග සඳහා ඉසින බව ගොවියෝ දනිති. සමහර ගොවීන් තමන්ගේ ආහාරය සඳහා පොහොර සහ රසානික නොමැතිව නිවෙස් අවට කුඩා වගා බිමක් පවත්වාගෙන යති. ඇත ගොවි ගම්මාන වලට ගිය විට බොහෝ තැන්වල මෙම තත්ත්වය දැකිය හැක. පොහොර හෝ රසායනික යෙදිය යුතු ප්‍රමාණ පිළිබඳ අප රටේ ගොවීන්ට අවබෝධයක් නැත. ඔවුන් සිතන්නේ ඒවා වැඩියෙන් යෙදීමෙන් වැඩි අස්වැන්නක් හා වැඩි අදායමක් ලැබෙන බවය.

වසරකට ලංකාවට විෂ සහිත පළිබෝධ නාශක පමණක් මෙ.ටො. 8000 ක් ආනයනය කරති. මේ විෂ සියල්ලම ලක් දෙරණ මත පතිත කරති. මෙයින් සිදුවූ පරිසර විනාශය කොතෙක් දැයි කත්සේරු කළ නොහැක.

මීට වසර 55 ට පෙර ජනයා ගොවිතැන් කිරීමේදී මෙවැනි විෂ පොළවට එකතු කළේ නැත. වසර 55 ක් තිස්සේ කොපමණ විෂ ගහ කොළට ඉසුවත් ගොයම් මැස්සා හා ඉල් මැස්සා වඳ කිරීමට ගොවියාට නොහැකි විය පසුගියදා රටේම බඩ ඉරිඟු වගාව විනාශ කළ සේනා දළඹුවා කිසිඳු රසායනික විෂ වර්ගයකින් විනාශ කිරීමට නොහැකි විය. දිනපතා වර්ධන වේගය ඉහළ ගියේය. සේනා දළඹුවාගේ වර්ධනය හීන කළේ දේශීයව නිෂ්පාදනය කළ පරිසර හිතකාමී කාබනික දියරයක් මගිනි. එය විෂ රසායනිකයක් නොවේ.

12 වෙනි පිටුවට

11 වෙනි පිටුවෙන්...

ආණ්ඩුව දන ගැස්සෙන ගොවි උද්ඝෝෂණ...

ලංකාවට ගෙන එනු ලබන පොහොර හෝ රසායනික ද්‍රව්‍ය පිළිබඳව නිසි ඇගැයීමක් ප්‍රමිතිකරණයක් ඇතැයි සිතිය නොහැක. ලියාපදිංචි නොවූ වෙලඳ ආයතන රැසක් පවතී, මොවුන් විවිධ දේ ගොවීන්ට විවිධ වෙළඳ නාම ඔස්සේ අලෙවි කරති. ගොවීන්ට මේ පිළිබඳව කිසිම දැනුමක් නැත. ඔහු පැලයේ හෝ භෝගයේ හෝ රෝගයේ ස්වභාවය කඩේ මුදලාලිට කියයි. මුදලාලි ඊට ගැලපෙන පොහොර හෝ රසායන ද්‍රව්‍ය ලබා දී යෙදිය යුතු ප්‍රමාණද පවසයි. ගොවියා එය අනුගමනය කරයි. ලංකාවේ ගොවීන්ගේ කෘෂි අධ්‍යාපනය හා දැනුම එසේය. එවන් තත්ත්වයක් තුළ රසායනික කෘෂිකර්මාන්තය අපේ රටට හිතකර නොවන බවට වෙනත් සාක්ෂි අවශ්‍ය නැත.

ලංකාවේ ජනතාවට අවශ්‍ය අඩු මුදලින් වැඩි අස්වැන්නක් හා වැඩි මුදල් ලාභයක්ය. ඒ සඳහා ඔවුන් මුදලාලි පමණක් නොව කවුරු මොනවා කීවත් ඒක අනුගමනය කරති. මේ නිසාම කාබනික ගොවිතැන ගැන රටේ කතිකාවතක් තිබුණි. එයට යොමු වූ පිරිසක්ද රටේ සිටිති. ඔවුන් එයින් ඉහළ ආදායමක්ද ලබති. නමුත් ඔවුන්ට එතරම් හඬක් නොමැත.

රජය මුලින් කළ යුතුව තිබුණේ පොහොර හෝ රසායනික නැවැත්වීම නොව කාබනික වගාකරුවන්ගේ හඬ අවදි කිරීමය. පොහොර 350 ට සහනාධාරය දෙන විට කාබනික වගාකරුවවන්ට වසරකට උදලු මිටක් හෝ රජයෙන් ලබා නොදුනි. ඔවුන් රජයේ ගොවි සමිති වලට වද්දා ගන්නේවත් නැත. එම ගොවීන් විසින්ම ස්වේච්ඡාවෙන් තම වගාවන් අළෙවිකර ගත්තේය.

ගොවිතැන යනු ධාර්මික රැකියාවක් බවට බුදුදහම තුළ පවා අර්ථකතනය කර ඇත. ඒ වර්තමාන ගොවිතැන නොවේ. ඒ පැරණි කාබනික වගාවයි. අද දස දහස් ගනනනේ සතුන් මරන මිනිසාට වස විෂ කවන කර්මාන්තයක් බවට ගොවිතැන පත්වී ඇත. ඒ අනුව වර්තමාන ගොවිතැන අධාර්මික කර්මාන්තයක් බවට පත්වී ඇත.

කාබනික වගාවට අත දැමූ ආණ්ඩුව අද වන විට සියතින් බෙල්ල කපාගත් තැනට පත්වී ඇත. එසේ පත්වීමෙන් පසු තම ප්‍රතිපත්තිය ආපසු ගැනීමට රජයට සිදුවිය. එය එසේ වන විට කාබනික වගාවට මෙතෙක් තිබූ ඉල්ලුමට නැවත පණ දීමට නොහැකි තරමට එය වලපල්ලටද ගියේය.

රජය නිසි ආකාරයෙන් සැලසුම් සැලසුම්කර සිදුකල යුතුව තිබූ උතුම් කාර්යක් බොරදියේ මාලු ඇල්ලූ විරුද්ධ පක්ෂ හා ජාවාරම්කරුවන් විසින් මෙම වස විසෙන් තොර ආහාරයක් ජනතාවට ලබා දීමේ සත්කාර්ය තවත් වසර ගණනාවකට ආපස්සට හැරවූහ.

හරි දේ වැරදි විදියට සිදුකිරීමට යෑමත් කෙසේ හෝ බලය ලබා ගැනීමත් යන අන්ත දෙක විසින් සත්‍ය යටපත් කර ඇත.

Ceylon Shipping Lines Ltd.

Printing Department

CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

Ceylon Shipping Lines Ltd.,
Printing Department,
No. 758/3, Dr. Danister De Silva Mawatha,
Colombo 09.
Tel: 011 - 2683237 Fax: 011 - 2683238
E- mail: cslpri@sltnet.lk

Head Office:
Ceylon Shipping Lines Ltd.,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8

අයිපල් කුළුන අලෙවිකල සොරදෙටුවා

ලොව ප්‍රධාන රටක් වූ ප්‍රංශයේ ඉදිකර ඇති අයිපල් කුළුන එම රටේ සංකේතය වී ඇත. වසරක් පාසා මෙය නැරඹීමට එන සංචාරකයින් සංඛ්‍යාව මිලියන ගණනකි. මෙම ලෝක ප්‍රකට අයිපල් කුළුන පිළිබඳව පුවත් පත් වාර්තාවක් පලවී තිබුණි. වසරක් පාසා අයිපල් කුළුන අලුත්වැඩියා කරමින් නඩත්තු කිරීම සඳහා ප්‍රැන්ක් දසදහස් ගණනක් මුදල් වැය වන බව ගණන් බලා ඇත. එහි හතර ස් යාර ලක්ෂ දෙකක් තීන්ත ආලේප කිරීම සඳහා පමණක් තීන්ත ගැලුම් 9213 ක් අවශ්‍ය වේ. එබැවින් මෙම කුලුන තවදුරටත් පවත්වාගෙන යාමට වඩා එය ගලවා ඉවත් කිරීම රජයට වාසිදායක බව ගණන් බලා ඇති අතර ඒ පිළිබඳව රජය සලකා බලාගෙන යයි..... මෙම පුවත්පත් වාර්තාව පලවීමත් සමග ප්‍රංශයේ ජනයා කඩිගුලක් සේ ඇවිස්සුනාහ. රජය නොදන්නා හා එවැනි කතාවක් ඇති නොවූ කරුණක් වාර්තා වීම නිසා රජයද අන්දුන් කුන්දුන් විය. ටික දිනකින් එය නිහඬ වී ගියේය.

ඒ නිහැඬියාවත් සමග වික්ටර් ලුස්ටික් නම් ලෝකප්‍රකට සොරා වහා ක්‍රියාත්මක විය. වික්ටර් යනු චෙකොස්ලොවැකියාවේ උපන් නොමිමර එකේ ගුරු කපටියෙකි. කුඩා කාලයේම ගෙදරින් පැන ගිය මොහු ඒ වනවිට පදිංචිව සිටියේ ප්‍රංශයේය. ඉහළම ගනයේ ධනවතුන් මුලාකොට මුදල් වංචා කරන්නෙකු වශයෙන් නමක් ලබා සිටි අයෙකි.

1887 ජනවාරි 28 වන දින කසල පස් පිඩැල්ල කපා තුස්ටාව් අයිපල් විසින් මෙම කුළුන ඉදිකිරීම අරඹන ලදී. එහි පාද එකිනෙකට එක්කර පළමු මහල දක්වා ඉදිකිරීමට වසරක් ගතවිය. ඒ අඩි 89 ක් ඉහළිනි. දෙවන තට්ටුව අඩි 748 ක් වන අතර තුන්වන තට්ටුව අවසන් වන්නේ අඩි 906 දීය. සියල්ලට ඉහළින් අඩි 986 අගල් 4 දී එහි කොඩි ගස ඉදිවෙයි. විවිධ වානේ කොටස් 15,000 එක් වී ඇති අතර විසි ලක්ෂ පනස් දහසක් රිවට් ඇණ වැය වී ඇත.

ප්‍රංශයේ අභිමානය ලෙස සැලකෙන අයිපල් කුළුන එරට තැපැල් අමාත්‍යාංශය භාරයේ පවතී. ප්‍රංශයේ සේන් නදිය අසබඩ හොම්දි මාර්ග යේ අහස උසට නැගී සිටින අයිපල් කුළුන මුදුනට මුළු පැරිස් නගරයම දැකිය හැක. ප්‍රංශයේ සංකේතය වූ මෙම ප්‍රතාපවත් යෝධයා අලෙවි කිරීම සුළුපටු කාරණයක් නොවුණත් වික්ටර්ට එය කජු කන වැඩකි.

වික්ටර් ලුස්ටික් පුවත්පත් වාර්තාවද රැගෙන තම මිත්‍රයා කොලින්ස් හමුවූයේ මද සිනාවකින් මුව සරසාගෙනය.

"බලහං මචං.. මේ පත්තරේ වාර්තාව"

"ආ.. ඔව් මම දැක්කා කොලින්ස් කීය."

"මේක මචං... අපිට සල්ලි ආකරයක්.. වික්ටර් තම සිනහව වැඩිකරමින් කොලින්ට කීහ."

"මේක කොහොමද අපිට සල්ලි ආකරයක් වෙන්නේ... මොකද අපි අයිපල් කුළුන ගලවන්නද... අනික රටම කලබල වුණ වාර්තාවක් කොලින්ස් කීය."

"හරි හරි... ඒක කරන්න අපිට ඕන රජයේ නිල මුද්‍රාව තියෙන ලෙටර් හෙඩ්ස් කීපයකුයි.. අපිට රජයේ නිලධාරීන් කියල පෙන්වන්න පුලුවන් සහතික කීපයකුයි විතරයි. ඒ ටික උඹ කරපන්කෝ වික්ටර් කොලින්ස්ට ඒ වැඩේ භාර දුන්නේය."

"හරි ... ඒ ටික මට කරන්න පුලුවන් කොලින්ස් කීය."

හොර සහතික හොර ලෙටර් හෙඩ් හොර රබර් මුද්‍රා හදන තැන් කොයි රටේත් ඇත. වික්ටර් පැවසූ ආකාරයට ඔහුට අවශ්‍ය ආකාරයේ ලියවිලි රැසක් කොලින්ස් දින කීපයක් තුළ වික්ටර් අතට පත් කළේය.

වික්ටර් අතට අවශ්‍ය ලියකියවිලි ලැබී දින කීපයකින් ප්‍රංශයේ ප්‍රධාන පෙලේ පරණ යකඩ මිලදී ගන්නා කෝටිපති ව්‍යාපාරිකයින් පස් දෙනෙකුට ලිපියක් ලැබී තිබුණි.

එහි රජයේ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් සඳහා අයිපල්

කුළුන පිළිබඳ කාර්යාභාර කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයා හමුවීම සඳහා පැරිස් නගරයේ ක්‍රිලන් හෝටලයේ සවස 5.00 ට හමුවන ලෙස දන්වමිනි. ලිපිය අත්සන් යොදා තිබුනේ අයිපල් කුළුනු පිලිබඳ කාර්යභාර කාර්යාංශයේ අධ්‍යක්ෂකවරයාය.

නියමිත දිනය එළඹිනි. සවස් කාලය විය.

ක්‍රිලන් හෝටලයේ අති සුඛෝපභෝගී සාකච්ඡා කාමරයට කෝටිපති ව්‍යාපාරිකයින් පස්දෙනා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයා ඇතුලු වූහ. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ව්‍යාපාරිකයින් පස්දෙනා ඉතාම සුහදව ගරු ගාම්භීරව පිළිගන්නා ලදී.

ක්‍රීම් පැහැති පූර්ණ යුරෝපීය ඇඳුමින් හා රතු ටයි පටියකින් සැරසී එහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ව්‍යාපාරිකයින් දෙස ගාම්භීර ලෙසත් මද සිනහවත් ඇතුව තියුණු ලෙස දැස් යොමු කළේය.

ටයිපටියේ ගැටය තරමක් බුරුල් කල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා උගුර පාදා සිය කතාව ආරම්භ කළේය.

"මහත්වරුනි... මේ හමුව ඉතා රහස්‍යයි. කිසි ලෙසකින් හෝ ප්‍රසිද්ධ වීමට සුදුසු නැහැ. දැනට ගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් අධ්‍යක්ෂතුමාත් මමත් පමණක් දන්න කරුණක් මම තමුන්නාන්සේලාට හෙළි කරන්න හදන්නේ... ඒ නිසා මේක අතිශයින්ම රහසක්" ඔහු කතාව මඳකට නතර කළේය.

ව්‍යාපාරිකයින් මුවගට මද සිනහව හා ආඩම්බරයද ඇතුලු විය. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් වරයා කවුලුවෙන් පිටත බැලීය. ප්‍රතාපවත් අයිපල් කුළුන අහසට නැගී සිටින දසුන දිස්විය. ව්‍යාපාරිකයින් ද සිය දෑස් ඒ වෙත යොමු කළහ.

නියෝජ්‍ය අධ්‍යක්ෂක නැවතත් කතාව ඇරඹීය.

"රාජ්‍ය භාණ්ඩාගාරයට බරක් වුණ දෙයක් අයින් කරන්නයි රජයේ සූදානම සමහර විට ඔබලා මෙය විශ්වාස නොකරනවාත් ඇති මේ අයිපල් කුලුන. මේක නඩත්තුවට දරන්න බැරි මුදලක් රජයට යනවා පසු ගිය දිනවල පුවත්පත් වාර්තාත් දකින්න ඇති..."

"ඔව්.. ඔව්.. අපි ඒව දැක්කා.. " ව්‍යාපාරිකයින් කීය.

"මේක 1889 නිදහස සංකේතවත් කරන්න ඉදිකල දෙයක් ඒ කාලේ අපිට ඒක බරක් නොවෙයි. ඒත් දැන් එය රටට බරක්. මේ ඉවත් කිරීම ගැන රජය දැන් තීරණයක් අරන් ඉවරයි. මේකේ ටොන් 7000 ක ඉස්තරම් වර්ගයේ වානේ තියෙනවා. ගලවා ඉවත් කරන අයට ඒ වානේ අයිති වෙනවා. ඒත් ගලවා ඉවත් කරන්න සහතිකය ලබා ගන්න රජයේ ගාස්තුවක් ගෙවන්න වෙනවා..." නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා දිගටම කරුණු පැහැදිලි කළේය.

"කීයද රජයේ ගනන..." ව්‍යාපාරිකයින් පස්දෙනාම විමසා සිටියේ ඒ යන මුදල පිළිබඳවය.

ඒ සඳහා රජය මුදලක් තීරණය කරලා තියෙනවා යැයි කියමින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා තුණ්ඩු කැබැල්ලක් ඔවුන් අතට පත්කළේය.

"හරි මම ඒ ගානට එකගයි." කෝටිපතියෙකු වූ යකඩ ව්‍යාපාරික ආන්ද්‍රේ පොයිසන් ඉදිරිපත් විය.

පැය කීපයක් ඇතුලත අයිපල් කුළුන ගලවා ඉවත් කිරීමේ සහතිකය හා ඒ සඳහා ගෙවන මුදලට රිසිට් පත් සකසා දීමට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කටයුතු කළේය. අදාළ මුදල ව්‍යාපාරිකයා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා අතටම දුන්නේය.

මෙවැනි ලාභදායක කටයුත්තක් ලබාදීම ගැන සන්තෝෂමක් ලබා දීමට අකමැති දැයි නියෝජ්‍ය අධ්‍යක්ෂ ආන්ද්‍රෝගෙන් විමසීය. එයටද එකඟ වූ ව්‍යාපාරිකයා ඒ කටයුත්තද ඉටු කළේය.

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් පෙනී සිටියේ වික්ටර් ලුස්ටික්ය. ඔහුගේ සහායක වශයෙන් සිය මිතුරා වූ කොලින්ස් පෙනී සිටියේය.

පසුදා වන විට දෙදෙනාම නැවතුනේ ඇමරිකාවේය. ආන්ද්‍රේ අයිපල් කුලුන ගැළවීමට ගිය අතර පොලීසිය ප්‍රශ්න කිරීමේදී තමා රැවටී ඇති බව වටහා ගත්තේය. ලැජ්ජාව හා අපකීර්තිය රැක ගැනීම සඳහා ආන්ද්‍රේ නීති මගට නොබැස්සේය.

විශාල මුදලක් ගරා ගත් වික්ටර් ටික කලක් ඔස්ට්‍රියාවේ වියානා නුවර සැඟවී සිටියේය. ටික කලකින් ඔහු නැවතත් ප්‍රංශයට පැමිණියේය. එසේ පැමිණ ටික දිනකින් ඔහු වෙනත් ව්‍යාපාරිකයෙකුට අයිපල් කුළුන අලෙවි කළේය. එම ව්‍යාපාරිකයා පොලීසියට පැමිණිලි කළ අතර වික්ටර් ඇමරිකාවට පැන්නේය.

ඇමරිකාවට පැනගත් ලුවිස්ටික් තම ක්‍රියා පිළිවෙත එළෙසම ගෙන ගියේය. ඔහු එරට පොලිස් නිලධාරියෙකුට හොර සල්ලි අච්චු ගසන මැෂිමක් අලෙවි කළේය. ඔහු එම මැෂිම අලෙවි කළේ එක්තරා කොන්දේසියක් හා වගකීමක් ඇතුවය. යම් විදියකින් මෙය ක්‍රියා විරහිත වුවහොත් දුන් මුදල ආපසු දී මැෂිම භාරගන්නා පොරොන්දුව මතය.

පොලිස් නිලධාරියා එය රැගෙන ගොස් ක්‍රියාත්මක කිරීමට උත්සහ කලද එය හරිගියේ නැත. පොලිස් නිලධාරියා සල්ලි මැෂිමද රැගෙන ලුස්ටික් හමුවීමට ගියේය. ඔහු අවංක ගනුදෙනු කරුවෙකු ලෙස පොරොන්දු ඉටු කරමින් දුන් මුදල දී මැෂිම ආපසු ගත්තේය.

ටික දිනකට පසු මෙම මුදල් ගනුදෙනු කිරීමට ගිය පොලිස් නිලධාරියා පොලීසියට කොටු විය. ඒ ව්‍යාජ මුදල් ලඟ තබා ගැනීම ගනුදෙනු කිරීම යන චෝදනාවටය. ඔහු සිරගත විය.

තවත් ටික කලකින් ලුස්ටික් පොලීසියට හසුවිය. ඒ ව්‍යාජ මුදල් හුවමාරු කිරීමට ගොසිනි.

සිරාගදරදී රෝගාතුර වූ වික්ටර් ලුස්ටික් සිරගතව සිටියදී මිය ගියේය. ඔහු ගේ මරණ සහතිකයේ රැකියාව වශයෙන් සඳහන්ව තිබුනේ පුහුණු වන වෙළඳ සේවක ලෙසිනි.

CEYLON SHIPPING LINES LTD
SPECIAL RATES ON COURIER PACKAGES
WE HAVE SPECIAL RATES FOR BELOW COUNTRIES
AUSTRALIA
CANADA
USA
NEW ZEALAND
GERMANY
UK
GEORGIA
BELGIUM
SPAIN
Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk

ගුණ දැන ආහාර ගන්න

ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා ලබා දෙන ආහාරය ගැන අද අපි එතරමම් සැලකිල්ලක් දක්වන්නේදැයි සිතා ගැනීමත් අපහසුය. දෛනිකව රැකී රක්ෂාවල යෙදී සිටින අය හැමදාම එක සමාන ආහාරයක් ගැනීම නිසා ආහාර රටාව වෙනස් නොවෙයි. කම්මැලිකම මුල්කරගත් ජීවිතවලටද ආහාරයේ නියම ගුණ අත්විඳිය නොහැක. සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබාගැනීමට අවශ්‍ය වන්නේ ආහාර වල ගුණ හඳුනාගැනීමයි. කම්මැලිකම දුරලා කටයුතු කරන අයට කාලයත් ආහාරත් සොයා ගැනීම දුර්ලබ නොවේ. ගුණවත් රසවත් ආහාර ඕනෑ තරම් වටපිටාවෙන් සොයාගත හැක. හඳුනා ගත හැක. වවා ගත හැක.

පෝෂ්‍ය ගුණයෙන් ඉහළ මෙම රසවත් ආහාර මීන් දසක දෙක තුනකට පෙර දුර්ලභ වුවත් ජාන විද්‍යාව දියුණු වීමත් සමග එය සුලබ ආහාරයක් විය. ඉතා සුළු මහන්සියකින් නිවසේ සාදාගත හැකි හතු ව්‍යාපාරික මට්ටමෙන් ද වවා ගත හැක.

හදවතට ගුණ දෙන හාතාවාරිය

ඔක්සිහාරක ප්‍රතිශතය බහුල ෆෝලේට් සහ පොටෑසියම් වලින් පොහොසත් වූ අඩු කිලෝ ජූල් ප්‍රභවයක් ඇති හාතාවාරිය ශරීරය සිසිල් කරයි. ඇස්පරගස් නමින් ද හඳුන්වන මෙහි ස්පියර හයක ෆොලේට මයික්‍රෝ ග්‍රෑම් 135 ක් අන්තර්ගතය. එය වැඩිහිටියෙකුට අවශ්‍ය නිර්දේශිත ප්‍රමාණයෙන් හරි අඩකි. බීටා කැරොටීන් මයික්‍රො ග්‍රෑම් 54 ක් පොටෑසියම් මිලිග්‍රෑම් 200 ක් අන්තර්ගතය.

හෘදරෝග සඳහා තුඩුදෙන හෝමෝ සිස්ටෙයින් සංයෝගය නිපදවීම ෆොලේට මගින් මර්ධනය කරන හෙයින් හාතාවාරිය ශරීරගතවීම නිසා හෘදරෝග ඇතිවීම වලකාලයි. ෆොලේට් මගින් කාන්තාවන්ගේ පැලෝපීය නාලවල සිදුවන අවහිරතා දුරලන හෙයින් මෙය කාන්තාවන්ට දිව ඔසුවකි.

හාතාවාරිය කැඳට හා මැල්ලුමට කොළ භාවිතා කරන අතර ඒවායේ අල හා අලවලින් ලබාගන්නා පිටිද භාවිතයට ගැනේ. සිංහල වෙඳකමේදී හාතාවාරිය අත්‍යාවශ්‍යම ඖෂධයක් වන අතර ඕනෑම පරිසරයක ඉතා පහසුවෙන් වවාගත හැකි ශාක විශේෂයකි.

බිම්මල් හෙවත් හතු ආහාරයඃ

රසයෙන් අනූන ආහාරයක් වන මෙය ජාන විද්‍යාවේ දියුණුවත් සමග සුලභ ආහාරයක් බවට පත්වී ඇත. අදින් වසර 5000 ට ප්‍රථම මිනිසා හතු භාවිතා කර ඇති බව පර්යේෂණවලදී සනාථ වී ඇත.

ප්‍රතිශක්තිකරණ ගුණයෙන් ඉහළ අගයක් ඇති මෙහි මේදය නැති තරම්ය. අධික ඛනිජ ලවන ප්‍රමාණයක් දක්නට ලැබේ. රුධිරයේ මේද ප්‍රතිශතය පහළ දමන අතර රුධිර පීඩනය දුරලීමට මහෝපකාරී වෙයි. හෘදරෝග හා පිළිකා රෝගී තත්ත්වයත් මර්ධනය කිරීමට හතු හෙවත් බිම්මල් සමත්වෙයි. මෙහි පොටෑසියම් අගය ඉහළ මට්ටමක පවතී. පුරස්ති ග්‍රන්ථවල හට ගන්නා පිළිකා තත්ත්වයන් දුරලීමට හතු වලින් ලැබෙන්නේ නොමද සහයකි.

හෘදය සුවපත් කරන සුදුළූනු

2002 වසරේදී නවදිල්ලි වෛද්‍ය විද්‍යා ආයතනයේ පර්යේෂකයින් ප්‍රකාශ කළේ "හෘද රෝග පිටු දැකීමට ඇති ලාබම ක්‍රමය සුදුළූණු" යනුවෙනි. සුදුළූණු ගෙඩියේ ඇති පටක වල අන්තර්ගත ඇලිසීන් මෙහි ඇති ප්‍රධානතම

රසායනික සංයෝගයයි. රුධිර කැටි දියකරන ශක්තිය මෙහි ඇත. රුධිර නාලිකාවල හටගන්නා රුධිර කැටි මෙමගින් දියකරයි.

පපුවේ කැක්කුම් රුදා ආදියට ඉතිහාසයේ පටන් ලංකාවේ ජනතාව සුදුළූණු හා උළුහාල් තම්බා බීම සිදුකරයි. නවීන විද්‍යාඥයන් සුදුළූනු ගැන පර්යේෂණ සිදුකිරීමට වසර සියගණනකට පෙර සිට දේශීය අම්මලා සුදුළූණු තැම්බූ වතුර පපුවේ ආබාධ ඇතිවූවන්ට ලබාදුනි.

රාත්‍රිය නොගැඹුරුයි

වැසි වැටෙන කාලයයි
දවස වියපත් බවයි
තරු සිහින ආකාසෙ
රාත්‍රිය නොගැඹුරුයි

බිර ගඳ පිණු වෙයි
ඇතු ගැබ කරුවලයි
එකුන් විසි වයස් වුන්
විසු රූ සේ සැලෙයි

අටයි තිහ කැඳවයි
මැද සාලෙ පුටුවලට
මෙගා හා අඩ'න්නට
බඩ මහත .... මහත
ගැහැනුන්ට පිරිමින්ට

හැට පිරුණු වඳුරු රැළ
අසුන් පිට උඩ නගියි
දාහෙ කොළ මොනර හොට
උන් කොටා බිම හෙලයි

නැවත නැවතත් නගියි
දහයෙ කනිසම වැදෙයි
නැවත නැවත වැටෙයි
මැදියම් රැය හඬ තලයි

මහල් තෙමහල මැඳුර
බිම අතුල බුමුතුරුණු
පිඳුරු පැල් තුළ අඳුරු
සත්ත්වයින් දැක සුහුරු
දුක බිය වේදනා පොදි
තුරුලූ කරගෙන හොඳට ම නිදී...

ගොංගිතොට සරත්

නොහඳුනන සෙනෙහස

ගිනියම් සුළගෙ දාහය පිසදා
සිසිල් පවම් රැල්ලක් විලසට
සරතැස නිවනට දිය බිඳුවක් වී
දෙතොල රැඳේවා
නොම දුටු සෙනෙහස

නොලියූ කවිවැල් හද තුළ තෙරපී
අකුරු කරන්නට
අයැදින සෙනෙහස
නොමදී විරහව නොම කඳුළක් වී
දෙනෙත රැඳේවා
නොමියෙන සෙනෙහස

පත්දුරු පුරවන බොඳවූ අකුරුත්
පැටලී කැටිවුණු සෙනේහයක්
මතුයම් දිනයෙක මහ කවියක් වී
කාට ඇසේදෝ
පිවිතුරු සෙනෙහස

බන්දුල ජයලත් - තැ.පෙ. 7836
- දෝහා - කටාර්

සුභ නව වසරක් වේවා..!

මහවැලි කැළනි වැනි ගංගා හසී — කොමළයි
හග්ගල පේරාදෙණි මල්වතු රට සුවඳ — කරයි
දසතින් නැගෙන නිල් වනපෙත — සිරියාවයි
ගිනි කඳු මර උගුල් නැති බිම හරි — හැඩකාරයි

මැදියම රන්වැනි රූබර සේද — ඇලී
නෙත සිත පිනයි ඉන්නට ඒ ඇසුරෙ — වෙලී
මුව මී ගෝන වග වළසුන් එකට — ගැලී
සුන්දර දසුන් මගෙ රට කරවාවි — එළී

පියගැට පෙළ වගේ දුම්බර වෙල් — යායයි
නුඹ කුස කරා ඉනිමං බැන්දූ — සේමයි
උඩරට එළිය කරවන නිල් තේ — යායයි
මුළු ලොව පුරා සිරිලක් නම — පතුරාලයි

සමනළ පිදුරු ගල මුදු නේ රිවිරි — කැ න්
සීගිරි ගලේ ලොව පරසි සොඳුරු — දසුන්
අනුරා පුර දිලේ නුඹ කුස රැඳි සම — සැරදුන්
මගෙ මව් බිම මිසක තව වේවිද මෙවැනි — දසුන්

අටුකොටු පිරී රට නිති සව් සිරි — දේවා
රෝ දුක් සතුරු උවදුරු යළි — නොමවේවා
සාමය සතුට සැම දින සිත රජ — වේවා
මගෙ ලක්මැණි හට සුභ නව වසරක් — වේවා...

වසන්ති සිංගප්පූරුවේ සිට

සංසාරේදී කළ අකුසල් ඇත බොහොම

පිනි කැට වැටෙන සීතල මහ පොළොව — ලද
දුක් කම්කටොලූ ඉවසාගෙන සිතේ — නද
ජීවන ගමන යන්නට සැරසෙනව — අද
ඒ යන ගමනේ සුභ සලකුණු පෙනෙයි — හොඳ

ජීවත් වෙන්න දහසක් විඳීනව — මෙහෙම
අතමිට මුදල නැති වූ විට වෙන — කොහොම
සංසාරෙයි කළ අකුසල් ඇත — බොහොම
මෙතැන් පටන් පින්දම් කරනවා — මෙහෙම

සයුරෙන් එතෙර රැකියාවක මම — ඉන්නේ
බිරිඳද දරුවන්ද මගෙ මව්රට — ඉන්නේ
සිතකින් නොවේ මම නම් දැන් මෙහි — ඉන්නේ
මොනවා කරන්නද කළ පව් පල — දෙන්නේ

**බලංගොඩ වේලිඔය එන්. කේ. ඩී. ආනන්ද
සෞදි රියාද් සිට**

Ceylon Shipping Lines Ltd.

- Container Freight Station
- Weighbridge Facility
- Container Storage, Repair & Haulage
- Reefer Monitoring
- Container Shifting, Stuffing, De-stuffing
- BIO Verification Centre

No. 70, Avissavella Road, Wellampitiya.
Tel. +94 - 11 -2043424, +94 - 11 -2572405
Fax. +94 - 11 -2572050
E mail. cslope@sltnet.lk, cslodt@sltnet.lk

Head Office:
No. 450, D.R. Wijewardane Mw, Colombo 10.
Tel. +94-11-2689500 Fax. +94-11-2689510
Web. www.ceylonshippinglines.lk

"ජීවත් වෙන්න නම් විදියක් නෑ" "කනව නෙවේ ලෙවකනවා" "බඩු නම් මාර ගණන්" මේ නිතරම සමාජයෙන් ඇසෙන අදෝනාය. ජීවිතය පවත්වාගෙන යනවා යැයි කියන්නේ සුලුපටු අභියෝග යක් නොවේ. ආණ්ඩු පත්වීමටත් පත්වූ ආණ්ඩු පෙරළීයාමටත් ජනතාවගේ ආර්ථික බර හේතු වෙයි. මෙම ජීවත්වීමේ අදෝනාව අපි අසන්නේ අදක ඊයෙක සිට නොවේ. අපේ මතකයේ හැටියට අපිට හය හතර තේරුන දා සිට වැඩිහිටියන්ගෙන් නිතර අසන්නට ලැබේ. ඒ දුක සමඟ ඔවුන් මිය ගිය පසු ඊළඟ පරම්පරාව ද එම අදෝනාවම ඉදිරියට රැගෙන යයි. මෙය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යන අඳෝනාවකි. මෙය බොරුවක්ද නොවේ. ජීවත් වීම යනු දැවැන්ත අරගලයකි. මේ සියල්ලක් කරන්නේද ජීවත්වීම සඳහාය.

හැමවිටම ආණ්ඩු නොකරන දේශපාලන පක්ෂ වල ප්‍රබල සටන් පාඨයක් වන මෙම ජීවන අරගලය මැනවින් වටහා ගන්නේ කපටි දේශපාලකයින්ය. දුප්පතුන්ගේ බත්වේලට යමක් නොමිලේ හෝ සහන මිලට දෙන බව මැතිවරණවලදී පොරොන්දු වන්නේ එබැවිනි. සමහර පොරොන්දු තාවකාලිකව ඉටුකරනු නමුත් ජනතාවගේ ජීවත්වීමට ඇති බාධකය ඉවත්ව නොයයි.

අධ්‍යාපනය සෞඛ්‍යය ප්‍රවාහනය ආදියට යම් සහනයක් ලැබේ. පිං පඩි දීමනා ප්‍රසාද මුදල් සහන මලු ආදියද ලැබෙයි. සමෘද්ධි පොලී රහිත ණය අඩුපොලී ණය මේ ආදී වශයෙන් පොදු සමාජයට යම්යම් සහන ලැබේ. කිසිවක් නොලැබෙන පරිසක්ද සිටිති. නමුත් ඒවා ලබා ගන්නා නොගන්නා සියලු සමාජයේ අති බහුතරය නගන පොදු මතය වී ඇත්තේ "ජීවත් වෙන්න විදියක් නෑ, බඩුමිල අහස උසට, ජීවන වියදම ඉහළයි" යන පොදු මතවාදයයි.

නගරයක ගමක වෙසෙන ආර්ථික වශයෙන් යම් සමෘද්ධියක් ඇති ඉඩකඩම් යාන වාහන ඇති හෝ යම් ව්‍යාපාරවල යෙදී සිටින හෝ මාසික වැටුපක් ලබන රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක කම්කරුවා ගේ සිට ඉහළ තනතුරක සිටි අයෙකු සමඟ හෝ කතා කිරීමේදී ඔවුන් තුළින්ද කියවෙන්නේ ජීවිතය පවත්වාගෙන යෑමට ඇති අගහිගකම් ගැනය.

කටු මැටි පැළක දරුකැලක් සමඟ දෛනික කුලී වැඩකින් එක් වේලක් කා ජීවිතය ගැට ගසා ගන්නා කේඩෑරි වූ වැන්දඹුවද වාහනයක් දෙකක් ඇති ඉහළ තනතුරක් දරණ ඉහළ වැටුපක් ලබන නිලධාරියෙකු වුවද මේ හැමටම මෙම අදෝනාව පොදු වන්නේ කෙසේද?

වර්තමාන ආර්ථික රටාව තුළ මාසිකව විසිදහසක් විසිපන්දහසක් තරම් ආදායමක් ලබන තුන් හතර දෙනෙකුගෙන් යුත් පවුලකට යන්තමින් තුන්වේල කෑමට එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් ඔවුන් තුළින් නැති බැරිකම කියා පෑමත් තුන් හතර දෙනෙකුගෙන් යුත් පවුලක මාසික ආදායම හැට හැත්තෑ දහසක් වූ විට ඔවුන් තුළින් කියවෙන නැති බැරිකම කියා පෑමත් අතර ඇති වෙනස අප තේරුම් ගත යුත්තේ කෙසේද? නමුත් මේ දෙපිරිසම සිය ජීවත්වීමට තම ආදායම මදි බවට අදෝනා කියති.

දිනෙන් දින වැඩිවන ජීවන වියදම

මාසික වැටුප රුපියල් විසි දහසක් තරම් ලබා ගන්නා කම්කරුවා වැටුප වැඩිකර ගැනීමට වර්ජන ගර්ජන උද්ඝෝෂණ පිකටිං පවත්වති. මාසික වැටුප ලක්ෂය ඉක්මවන රාජ්‍ය සේවකයාද සිය වැටුප වැඩිකර ගැනීම සඳහා ගර්ජන වර්ජන තර්ජන උද්ඝෝෂණ පිකටිං පවත්වති.

රාජ්‍ය හෝ පෞද්ගලික අංශයක සේවය නොකරන නිෂ්පාදන සේවයේ යෙදී සිටින ගොවි ජනතාව නව නිෂ්පාදන වල මිල මදි යැයි වීදි බසිති. ඔවුන් අපේක්ෂා කරන්නේ නව නිෂ්පාදන සඳහා උපරිම ඉහළම මිලක්ය. එය මිලදී ගන්නා පාරිභෝගි කයා අපේක්ෂා කරන්නේ තමා මිලදී ගන්නා දෙයට උපරිම අවම මිලක්ය. නිෂ්පාදකයා හැමවිට එක් දෙයක හෝ භාණ්ඩ කීපයක නිෂ්පාදකයෙක් වුවත් ඔහු ඊටත් වඩා භාණ්ඩ සංඛ්‍යාවක පාරිභෝගික යෙකි. ඔහු තමාගේ දේට උපරිම මිලක් අපේක්ෂා කළත් තමා ගන්නා දේට අවම මිලක් අපේක්ෂා කරයි. සැමවිටම නිෂ්පාදකයින්ට වඩා ගැනුම්කරුවන් වැඩිය.

ජීවත් වීම අපහසුයි යන අඳෝනාව නගන කිසිවෙකු පහසුවෙන් ජීවත් වීම සඳහා උත්සාහ දරන බවක් නොපෙනේ. ජීවන වියදම වැඩියි වැඩියි කියා කෙතරම් හඬ නැගුවත් ජීවන වියදම අඩුකර දෙන ලෙස රජයෙන් හෝ පොදු සමාජයෙන් ඉල්ලනවා විනා තමා විසින් වියදම් අවම කර ගැනීමේ උත්සාහයක නොයෙදෙයි.

ජීවත් වීමේ අරගලයෙන් ඇත්තටම පීඩාවට පත්වන්නේ ඉතාම දිළිඳු අහිංසක අසරණ ම කොටස්ය. සෙස්සෝ පීඩාවට පත්වන්නේ ජීවිත අරගලයට නොව තමා තුළ ගොඩ නැගී ඇති මනෝරාජිත සමාජ මහන්තත්වය ඉහළ දමා ගැනීමේ අරගලයකය. මේ අරගලයන් දෙක එකක් නොව දෙකකි. මෙය තේරුම්ගන්නා තාක්කල් සැම අයෙකුටම නිරන්තර මනෝ විකාරයකින් පීඩාවට පත්ව බලවත් මානසික පීඩනයකින් ජීවත් වීමට සිදුවෙයි. මෙම මානසික ව්‍යාධිය සෙසු සමාජයට නොපෙනුනත් හුදකලාව තම තමා විසින් නිරන්තරව පීඩා විඳිති. මෙය මෝහය නොහොත් මුලා වීමකි.

ඇත පිටිසර කටුමැටි පැලක වෙසෙන දරු දෙතුන් දෙනෙකු සිටින සැමියා මියගිය නිරන්තර ලෙඩරෝග වලට ගොදුරු වන වැන්දඹු කාන්තාවක ජීවන අරගලයක යෙදෙමින් බඩ වියත රැක ගැනීමට දුක් පීඩා විඳිති. ඒ පීඩාව තුළ ඔවුන්ද සිය ජීවිතය ගැට ගසා ගනිති. ඔවුන් ගේ පීඩාව ආහාරය හා සෞඛ්‍යය උදෙසාය.

මධ්‍යම පංතිය හෝ මධ්‍යම පංතියෙන් ඉහළ තමන්ට කියා ස්ථිර නිවසක් ඇති ස්ථිර ආදායමක් ඇති පාන්තිකයින්ටද ජීවත්වීමට ඇති අපහසුව ගැන සිතමින් හා අන් අය සමඟ කියමින් අපමන මානසික පීඩාවකට පත්ව සිටිති. මොවුන් අපේක්ෂා කරන්නේ ආහාර සෞඛ්‍ය ඉක්මවා ගිය තවත් අපේක්ෂාවන්ය. තමා ඉන්න මට්ටමට කොහොම වුවත් අපේක්ෂා දිනෙන් දින අලුත් වෙමින් දලු දමමින් වැඩෙති. එම අපේක්ෂා ඉටු නොවන තැන ඇති වන පීඩාව විසින් නැති බැරිකමේ අදෝනාව අඩු වැඩි වශයෙන් ඉස්මතුවෙයි. ඒ නිසා නැති බැරිකම යනු හුදෙක්ම මානසික තත්ත්වයක් විනා නැති හා බැරිකමක්ම නොවේ.

නැති බැරි පිරිස් සිටිති. ආබාධිත පිරිස් ශරීර සෞඛ්‍යයෙන් දුර්වල පිරිස් විශේෂය. තමා තුළ ගොඩනැගී ඇති කම්මැලිකම හේතුවෙන් තමාට අහිමි වන හා ඉටු කරගත නොහැකි දේවල වගකීම පවා ඔවුන් අන් අයට බැරකරමින් දොස් නගති. තම ශරීර සෞඛ්‍ය ගැන පවා නොසිතා මීටර් දෙතුන් සියයක් පයින් යෑමට නොහැකි කම්මැලියන් බෙහෙත් මිල හා ප්‍රවාහන ගාස්තු ගැන අදෝනා තබති. නිවසේ දැල්වෙන අමතර විදුලි බුබුල නිවා නොදමන එකා මාසෙ අන්තිමට විදුලි බිල බලා හූල්ලති. ඉවත දමන බඳුන් කෑල්ලක පලා කොළයක් නොඉන්දන ගෘහනිය එළවලු මිල ගැන දෙස් දෙවොල් තබයි.

තමා ඉතා පහසුවෙන් පාලනය කළ හැකි නමුත් නොසැලකිල්ල හා කම්මැලිකම හේතුවෙන් අපි අතින් ගිලිහී යන ආර්ථික ප්‍රතිලාභ රැසක් අතහැර දමා ජීවන වියදම ගැන අදෝනා තැබීම කලාවක් බවට පත්කර ගත් සමාජයක් අප අතර සිටින බව හොඳින් නිරීක්ෂණය කළ විට දැක ගත හැක. බස්රියක දුම්රියක කි.මී. කීපයක් යන මගියෙකුට වල් වැදී ගිය පුරන් වූ ඉඩකඩම් හා ගෙවතු ඕනෑ තරම් දැකිය හැක. ඒවායින් ජනතාව නිසි ප්‍රයෝජනයක් ගන්නා බවක් නොපෙනේ. ඕවා කරන්න වෙලාවක් නෑ දෙයක් හදන්න ඉඩක් නෑ ආදී වශයෙන් කම්මැලිකමට හා නිර්මාණාත්මකව සිතීමට ඇති නොහැකියාව ඉදිරිපත් නොකර වෙනත් වැල්වටාරම් දොඩමින් දහසක් හේතු දක්වති.

තම තමන්ට හැකි දේ තේරුම් ගෙන තම වටපිටාව ගැන මනා වැටහීමක් ඇතුව තමා දියුණු විය යුතුයි. යන හැඟීමෙන් කම්මැලිකම පසෙක ලා කටයුතු කරන ඕනෑම අයෙකුට වැඩිවන ජීවන වියදමට මුහුණ දීය හැකිය. අනුන් හෝ රජය අපේ ජීවන වියදම පහළ දමන තෙක් බලා නොයිද අපේ ජීවන වියදම අභියෝග යක් කොට සලකා එයින් ජය ගැනීමට තම තමා විසින් උපාය උපක්‍රම භාවිතා කළ හැකිනම් ජීවන වියදම පහළ දමා ගැනීම අපි සිතන තරම් අමාරු දෙයක් නොවේ.

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
Ceylon Shipping Lines Ltd

ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.

ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
C. S. L. Australia
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
✆ +61397929877/0061 396023966
🖷 +61397924655
✉ cargo@skyway.com.au/www.skyway.com.av

ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜூரியா இன்டர்நெஷனல்
Juria International
✆ +81283205383
🖷 +81283205384
Mobile - 0081-(90) 31027600
✉ tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

සර්ෆායර් ඉන්ටර්නැෂනල්
ஷபீர் இன்டர்நெஷனல்
Sapphire Int.
Sakae Cho 1 - 15 - 29
Higashimurayanna City, Tokyo - Japan.
✆ 042 - 936 - 6517

සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்.
M & S Express Cargo Logistics Pte. Ltd.
No. 23, Daihousie Lane, Singapore - 209688
✆ +6563966614 / +6563966615
🖷 +6563966621
✉ sales@ms5.com.sg / mifras@ms5.com.sg

දෝහා - කටාර් / தோஹா - கட்டார்
Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
Lans Global Logistics
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
✆ +974 40 414141
🖷 +974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
✉ cmb@lanslogistics.com

ගල්ෆ් පැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்விசஸ் கம்பனி
Gulf Falcon Services Company (W.L.L.)
PO Box - 7079, Doha - Qatar.
✆ +974 44869723
🖷 +974 77885503 / +974 77883866
✉ gulffalconcargoqatar@gmail.com

ටයිටැනික් වේස් කොමර්ෂියල් සර්විස්
Titanic Ways Commercial Service
8279 King Fahad Road, Al Faiha District
P.O. Box : 9184
Jeddah 22241 - 2158 - Kingdom of Saudi Arabia
✆ +966126447050 🖷 +966 126447050
Mobile: +966556258377 / +94 777901274
✉ mkt@titanicways.com

මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
Jayalanka (M) SDN BHD
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
✆ 603-40421896 / +966 539222031
00966 532480407
✉ jay_langka@yahoo.com
jayalankacargo@gmail.com

කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
Falcon Cargo
2952, Safat 13154, Kuwait
✆ 0096522419095, 0096522457315
🖷 0096522419098
✉ falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
United Express Logistic
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
✆ +9652495858/+9652470862/+96522495898
✉ info@unitedexpresslogistics.com

ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. /
Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
Embassy Shipping & Frieght LLC
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
✆ Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
🖷 Fax: +971 4 320 71 71
✉ info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
✆ +971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
✆ +971 42895750
✉ hirumooncargo@gmail.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
Ocean Lanka Cargo
P.O. Box - 48843,
Dubai - UAE
✆ 00971-04-2640054
Mobile - 00971-0555 491 987
✉ oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
Lakbima Cargo
P.O. Box - 22675,
Ajman, UAE.
✆ +971 6 7480522
✉ lakbimacargo@gmail.com

බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
Colombo Cargo Company
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
✆ +973 35939343
🖷 +973 17 811707
✉ colombosuppliersbhn@gmail.com

සවුදි අරාබිය / சவுதி அரேபியா
Saudi Arabia

Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
World Wide Freight
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al Gahathani Trading Est) Jeddah, K.S.A.
✆ 0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
✉ imthiyaz85360@yahoo.ca

දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
ABT Cargo Services
✆ +966550952031

රියාද් - றியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
ABT Cargo Services
Riyadh Office: +966 112700055
✆ +966555892754
+966532083640
✉ abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
✆ 2442032/4793845/0508273719
🖷 4793845 / 00966 - 583090555
✉ fameruhcmb@gmail.com

ජී එම් අයි ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්
G M I International Pvt Ltd.
German
Mobile: +94 777150997
✆ +94 112890099
🖷 +94 112890099
✉ indika@gmi.lk

ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து
Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
M C S Cargo
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
✆ 0041-796656563 / 0041- 443025838
✉ mcscargo@swissmail.com

කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
Ceycan Transcontinental
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
✆ +9056739873
🖷 +9056739905
✉ cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

එංගලන්තය / இங்கிலாந்து
United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
JPN Shipping
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
✆ 02086680252
✉ info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
Mass Global Shipping
✆ 044(0)208 4221232
🖷 208 8644244
✉ info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
Easy Shipping Ltd.
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
✆ 02086489092 / 07908787627
🖷 info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
Atlas Shipping
430, High Road, Willesden,
London. NW 10 2HA
✆ 02084596633 / 0794743535
✉ ajantha.atlasshipping@gmail.com

ඇමරිකාව /அமெரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
Colombo Express
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
✆ 1888 232 1952
✉ nishan@colomboexpress.com
www.colomboexpress.com

Ceylon Shipping Lines Ltd

450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617



Ceylon Shipping Lines Ltd.

SLSI SYSTEM CERTIFIED ISO 9001

MGMT. SYS. RvA C 155

PATA Pacific Asia Travel Association

IATA

IAASL

Serving with Excellence

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing